

# 3 පරිච්ඡේදය

# මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

## සාරාංශය

මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමෙන්, 2025 වසරේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති ඉහළ සහ තිරසර ආර්ථික වර්ධනයක් සඳහා හිතකර පරිසරයක් නිර්මාණයට සහාය විය. 2023 වසරේ මැද භාගයේ දී ආරම්භ වූ මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය 2025 වසර පුරාම අඛණ්ඩව පැවති අතර, එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය එක් වරක් මැයි මාසයේ දී අඩු කරන ලදී. දේශීය වශයෙන් පැවති අවධමනකාරී තත්ත්වය, මනාව පාලනය වී ඇති උද්ධමන අපේක්ෂා, දුර්වල වන ගෝලීය ඉල්ලුම සහ විදේශ වෙළඳාම ආශ්‍රිතව අඛණ්ඩව පවතින අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින් මෙම ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වා ගන්නා ලදී. වසර තුළ මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ අතිරික්තයක් පැවති අතර, ඒ සඳහා මහ බැංකුව විසින් ශුද්ධ පදනමින් සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය මිලදී ගැනීම ප්‍රධාන වශයෙන් සහාය විය. වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්ව සමඟ, මහ බැංකුව 2025 වසරේ ජනවාරි මස අවසානයේ සිට ද්‍රවශීලතා සැපයීමේ විවට වෙළඳපොළ කටයුතු අත්හිටුවන ලදී. සමස්තයක් ලෙස ලිහිල් මුදල් තත්ත්ව පැවතීම, පොලී අනුපාතික පුළුල් ලෙස පහත වැටීමට සහ පෞද්ගලික අංශයට ලබා දෙන ණය ශක්තිමත් ලෙස වර්ධනය වීමට දායක වූ අතර, 2025 අගෝස්තු මාසයේ සිට උද්ධමනය නැවත ධන අගයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2025 වසරේ දෙවන භාගයේ දී, මුදල් වෙළඳපොළෙහි සහභාගීත්ව ආයතන අතර රුපියල් ද්‍රවශීලතාවයේ අසමාන ව්‍යාප්තිය සහ විශේෂයෙන් දිට්වා සුළි කුණාටුවෙන් පසුව රජයේ මූල්‍යන අවශ්‍යතා වැඩිවීම හේතුවෙන් කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතිකවල තාවකාලික ඉහළ යෑමක් දක්නට ලැබුණි. එසේ වූවද, සමස්ත අතිරික්ත ද්‍රවශීලතාව සහ පෞද්ගලික අංශයේ ණයෙහි අඛණ්ඩ වර්ධනය සැලකිල්ලට ගෙන, මහ බැංකුව වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීමෙන් වැළකී සිටියේය. 2026 වසරේ මුල් කාලය වන විට, රුපියල් ද්‍රවශීලතාව වඩාත් ඒකාකාරව බෙදී යෑමත් සමඟ කෙටි කාලීන පොලී අනුපාතික පහළ ගියේය. 2024 වසරේ දෙවන කාර්තුවේ සිට උද්ධමනය 5%ක ඉලක්කයෙන් ප්‍රතිශතාංක 2කට වඩා අඩු මට්ටමක පැවති බැවින්, මහ බැංකුව විසින් උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වීමට හේතු, මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගනු ලබන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් පිළිබඳ පැහැදිලි කරමින් 2025 වසරේ දී පාර්ලිමේන්තුවට වාර්තා හතරක් ඉදිරිපත් කර ඒවා මහජනතාවට ලබා ගත හැකි පරිදි ප්‍රකාශයට පත් කළ අතර, එමගින් මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම සහතික විය.

නම්‍යශීලී විනිමය අනුපාත ප්‍රතිපත්තියක් පවත්වා ගනිමින්, මහ බැංකුව විදේශ විනිමය මිලදී ගැනීම් හරහා දළ නිල සංචිත නැවත ගොඩනැගීමට අඛණ්ඩව කටයුතු කළේය. විදේශීය අංශයේ වැඩිදියුණු වූ තත්ත්ව සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ සිට පනවන ලද ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග කිහිපයක් ද මහ බැංකුව විසින් ලිහිල් කරන ලද අතර, මෝටර් රථ ආනයන ඇතුළු ආනයන සඳහා වූ සීමා සම්පූර්ණයෙන් ලිහිල් කිරීමට රජයට නිර්දේශ සහ නිර්දේශ ලබා දුන්නේය. වාහන ආනයන සීමා ඉවත් කිරීම වෙළඳ හිඟය පුළුල් වීමට දායක වුවද, එය 2025 වසරේ දී රජයේ ආදායමේ සැලකිය යුතු වැඩිවීමකට ද හේතු විය.

සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස, මහ බැංකුව පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු නම් කිරීම සඳහා වූ රාමුව යාවත්කාලීන කිරීම සහ වාහන ණය සඳහා අධික ලෙස නිරාවරණය වීම වැළැක්වීමට වටිනාකම් මත ණය අනුපාත සංශෝධනය කිරීම මගින් මූල්‍ය අංශයේ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව දියුණු කළේය. තාක්ෂණික අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ සයිබර් ආරක්ෂණ සූදානම අවධාරණය කරමින් බලපත්‍රලාභී බැංකු සඳහා මහ බැංකුව විචක්ෂණශීලී රෙගුලාසි කිහිපයක් නිකුත් කළේය. තවද, බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රතිසාධන

**සැලසුම් සකස් කිරීමට බැංකුවලට නියම කරන ලදී. වැඩිදියුණු කරන ලද ද්‍රවශීලතා සහ ණය අවදානම් කළමනාකරණ නියෝග හරහා මහ බැංකුව විසින් මුදල් සමාගම් නියාමනය දැඩි කරන ලද අතර, තිරසර ව්‍යාපාරික පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා තැන්පතු සහ ණය උපකරණ අනුපාතික සඳහා සීමා පනවන ලදී. ඒ සමගම, මුදල් සමාගම් සඳහා වූ ඒකාබද්ධකරණ සැලැස්මේ IIවන අදියර යටතේ අධීක්ෂණය කිරීම් ආරම්භ කරන ලදී. මහ බැංකුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, ශක්තිමත් කරන ලද ණය අවදානම් කළමනාකරණ රාමුවක් යටතට ගෙන එන ලද අතර, අනවසර තැන්පතු ලබා ගන්නා ආයතනවලට එරෙහිව නීතිය බලාත්මක කිරීමේ පියවර ගන්නා ලදී. මේ අතර, 2025 වසර අවසානය වන විට මහ බැංකුව විසින් සිදු කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට බාධාවකින් තොරව පවරා දීමට පහසුකම් සැලසූ අතර, එමගින් රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් එක් එක් ආයතනයට පැවරී ඇති වගකීම් පිළිබඳ පැහැදිලි භාවය වැඩිදියුණු විය.**

මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විෂයමාලා සංවර්ධනය සඳහා මහ බැංකුව, අධ්‍යාපන හා ජාත්‍යන්තර ආයතන සමඟ ද හවුල් විය. ගෙවීම් ක්ෂේත්‍රය තුළ, ගාස්තු අඩු කිරීම්, ගෙවීම් සීමා වැඩි කිරීම සහ LANKAQRහි ගෝලීය අනුකූලතාව වැඩිදියුණු කිරීම හරහා මහ බැංකුව ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කළේය. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමට වූ මූලපිරීම්වල ප්‍රගතිය අඛණ්ඩව සිදු වූ අතර, නෛතික ප්‍රතිසංස්කරණ සහ ඉදිරියේ දී සිදු කෙරෙන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ පෙර සූදානම ඒ සඳහා සහාය විය. ප්‍රතිපත්තිමය ඌනතා තක්සේරු කිරීම, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූල කිරීම සහ ආයතනික ශක්‍යතාව වැඩිදියුණු කිරීම මගින් 2025 වසරේ දී මහ බැංකුව මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කළේය. සියලුම මූල්‍ය ආයතන සඳහා නිරාකරණ ප්‍රතිපාදන ව්‍යාප්ත කිරීම සහ නිරාකරණ කටයුතු සඳහා ඇති සූදානම ඉහළ නැංවීමට ස්වාධීන තක්සේරුකරුවන්ගේ මණ්ඩලයක් ස්ථාපිත කිරීම මගින් මහ බැංකුව තැන්පතු රක්ෂණ සහ නිරාකරණ රාමුව ශක්තිමත් කළේය. මීට අමතරව, 2025 වසරේ දී තිරසර මූල්‍ය පිළිබඳ පෙර දැක්ම 2.0 දියත් කිරීම මගින් මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම්වලට දේශගුණික සහ සමාජීය කරුණු පිළිබඳව සලකා බැලීම් ඒකාබද්ධ කිරීමට මහ බැංකුවේ ඇති කැපවීම පෙන්නුම් කළේය.

සමස්තයක් ලෙස, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, දේශීය මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමේ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක විය. 2025 වසර තුළ දී උද්ධමනය ඉලක්කගත මට්ටම කරා මෙහෙයවීම සඳහා ප්‍රතිපත්ති සකස් කරන ලදී. අඛණ්ඩව පවත්වාගෙන ගිය ලිහිල් මුදල් තත්ත්වය මගින් ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වූ අතර, එමගින් පෞද්ගලික අංශයේ ණය සැලකිය යුතු ලෙස වර්ධනය විය. විවිධ අංශවල පාර්ශ්වකරුවන් සමඟ නිරන්තරයෙන් පවත්වන සබඳතාවල දී, මහ බැංකුව විසින් විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීමට දරන උත්සාහයන් මගින් මුදල් ප්‍රතිපත්තිය සහ එහි මෙහෙයුම් පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම ඵලදායී වී ඇති බව පෙන්නුම් කෙරේ. මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීමේ මහ බැංකුවේ භූමිකාව පිළිබිඹු කරමින්, සැලකිය යුතු අභියෝග මධ්‍යයේ වුවද මූල්‍ය අංශය ශක්තිමත්ව පැවතුණි.

## 3.1 මුදල් ප්‍රතිපත්ති රාමුව

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාවය අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම මහ බැංකුවේ මූලික අරමුණ වන අතර, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.** මෙම මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, මහ බැංකු පනතට අනුව, නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුවට අනුකූලව මුදල් ප්‍රතිපත්තිය සැකසීමේ සහ නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මහ බැංකුවට පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ තීරණය කර ඇති ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වාගෙන යෑමට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව අරමුණු කරයි. 2023 වසරේ ඔක්තෝබර් මස 5 වැනි දින රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක අගයක පවත්වා ගත යුතුය. තවද, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ, වාර්තා වන උද්ධමනය, උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීමට ඇති හැකියාව මැනීමට සහ මහ බැංකුවේ වගවීමේ අවශ්‍යතාව සඳහා ප්‍රතිශතාංක ±2ක ආන්තිකයක් සඳහා ඉඩ ලබාදී ඇත.

**උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත මාවත ඔස්සේ මෙහෙයවීමට මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි.** 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ සිට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙත යොමු වීමෙන් පසුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය කරන ප්‍රධාන මුදල්

ප්‍රතිපත්ති උපකරණය ලෙස ක්‍රියාත්මක වේ. කෙටි කාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකයක් වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියා කරයි. කෙටි කාලීන පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වරින් වර සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී එය වෙනස් කරනු ලබයි. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ප්‍රකාශයට පත් කළ පසු, පවතින සහ අපේක්ෂිත දේශීය ද්‍රවශීලතා තත්ත්ව සැලකිල්ලට ගනිමින්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රකාශිත එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතික මට්ටමේ හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමේ අරමුණින් මහ බැංකුව මුදල් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ සුදුසු පරිදි වෙනස් කිරීම සිදු කරයි. මෙම ක්‍රියාවලිය හරහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූල වන එක්දින වෙළඳපොළ පොලී අනුපාතික, මූල්‍ය වෙළඳපොළ හරහා සමස්ත ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වන අතර, අවසානයේ දී උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබයි.

**විනිවිදභාවය සහ මහජන වගවීම වැඩිදියුණු කිරීම අවශ්‍ය කරන අතරම, මහ බැංකුවේ අරමුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකු පනත මගින් ඉහළ ස්වාධීනත්වයක් ලබා දෙයි.** මිල ස්ථායීතාව සම්බන්ධයෙන් සැලකූ විට, මහ බැංකුව විසින් අනුක්‍රමික කාර්තු දෙකක දී මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම මගින් දක්වා ඇති ප්‍රතිශතාංක ±2ක ආන්තිකයෙන් උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වුවහොත් (එනම් කාර්තුමය මතුපිට උද්ධමනය අනුක්‍රමික කාර්තු දෙකක දී 3.0%-7.0% පරාසයෙන් පිටත මට්ටමක් වාර්තා කළහොත්) මහ බැංකු පනතට අනුව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය යුතුය. එම වාර්තාව මගින් උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගනු ලබන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් දක්වා තිබිය යුතුය. 2024 වසරේ අවසාන කාර්තු තුනෙහි සහ 2025 වසර තුළ දී කාර්තුමය මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා පහළින් පැවතීම හේතුවෙන් මෙවැනි වාර්තා පහක්, පිළිවෙළින්, 2024 වසරේ දෙසැම්බර්, 2025 වසරේ මාර්තු, ජූනි, අගෝස්තු සහ දෙසැම්බර් මාසවල දී මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු අතර, හයවන වාර්තාව ද 2026 වසරේ මාර්තු මාසයේ දී මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මහ බැංකුවේ නිල වෙබ් අඩවිය හරහා මහජනතාවට මෙම වාර්තා වෙත ප්‍රවේශ විය හැකිය.[1] තවද, උද්ධමනයේ හැසිරීම්, උද්ධමනයට බලපාන සාධක, මැදි කාලීන උද්ධමන පුරෝකථන සහ එම පුරෝකථන වෙනස් වීම කෙරෙහි බලපෑ හැකි ප්‍රධාන අවදානම් මෙන්ම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳව පැහැදිලි කරමින් මහ බැංකුව විසින් ද්විවාර්ෂික ප්‍රකාශනයක් වන මුදල් ප්‍රතිපත්ති වාර්තාව සෑම වසරකම පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී ප්‍රකාශයට පත් කරනු ලබයි. මහ බැංකුව විසින් සිය පුළුල් මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන රාමුවේ කොටසක් ලෙස, විවට වෙළඳපොළ කටයුතු, ද්‍රවශීලතා කළමනාකරණය, කෙටි කාලීන පොලී අනුපාතිකවල ප්‍රවණතා සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ඇතුළු මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ද්විවාර්ෂික වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව 2025 වසරේ දී අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මහ බැංකුවේ කාර්යයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අධිපතිතුමා, පාලක මණ්ඩලයේ හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකයින් සහ නියෝජ්‍ය අධිපතිවරුන් පාර්ලිමේන්තුවට හෝ එහි කමිටුවලට කැඳවනු ලැබිය හැකිය. ඒ අනුව, එවැනි කමිටුවල ඉල්ලීම පරිදි පාර්ලිමේන්තු කමිටුවලට මහ බැංකු නිලධාරීන් සහභාගී වීමට අමතරව, 2025 වසරේ ජනවාරි, ජූනි සහ නොවැම්බර් මාසවල දී සහ 2026 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල දී පාලක මණ්ඩලයේ හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකයින් සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් පාර්ලිමේන්තුව සහ/හෝ එහි කමිටු දැනුම්වත් කරන ලදී. රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකු පනත යටතේ පිහිටුවා ඇති කාර්තුමය වශයෙන් රැස්වන සම්බන්ධීකරණ සභාව හරහා පහසුකම් සලසන අතර, එහිදී සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම, අවදානම් සහ මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශය සම්බන්ධ කටයුතු පිළිබඳව අදහස් හුවමාරු කර ගනියි. සම්බන්ධීකරණ සභා රැස්වීම්වලට සමගාමීව, එම රැස්වීම්වල කටයුතු සඳහා පහසුකම් සැලසීම පිණිස රාජ්‍ය මූල්‍ය සහ මුදල් අධිකාරීන් අතර තාක්ෂණික මට්ටමේ රැස්වීම් ද පවත්වනු ලැබේ. මෙම සම්බන්ධීකරණ කටයුතු මගින් මහ බැංකුවේ ප්‍රතිපත්ති, මෙහෙයුම් සහ පැවරුණු කාර්යභාරය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ සමස්ත අවබෝධය ඉහළ නංවා ඇති අතරම, විවිධ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් හා ප්‍රතිචාර ලබා ගැනීම සඳහා මහ බැංකුවට අවස්ථාව සලසා දෙමින් ප්‍රතිපත්ති සම්පාදනය සහ වගවීම ශක්තිමත් කර ඇත.

1 මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තා වෙත මෙතැනින් ප්‍රවේශ විය හැකිය: https://www.cbsl.gov.lk/en/monetary-policy/monetary-policy-communication/accountability-to-parliament

3

විශේෂ සටහන 4

## ශ්‍රී ලංකාවේ මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය

සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යෑමේ දී සහ තිරසර ආර්ථික වර්ධනයට සහාය දැක්වීමේ දී මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර ඵලදායී සම්බන්ධීකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මිල ස්ථායීතාව පවත්වාගෙන යෑම සඳහා මහ බැංකුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග මුදල් ප්‍රතිපත්තියට ඇතුළත් වන අතර, බදුකරණය, රජයේ වියදම් සහ ණය කළමනාකරණය පිළිබඳ රජය විසින් ගනු ලබන තීරණ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අයත් වේ. මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සතුව එකිනෙකට අනුපූරක හෝ එකිනෙකට පටහැනි වූ අරමුණු පැවතිය හැකි අතර, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බලපාන කාල පරාසය එකිනෙකට වෙනස් විය හැකිය. නිදසුනක් ලෙස, 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදය සමයේ දී නිරීක්ෂණය වූ පරිදි, මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යන ද්විත්වයෙහිම අරමුණ වූයේ සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ළඟාකර ගැනීමයි. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවල දී මෙම ප්‍රතිපත්තිවල අරමුණු එකිනෙකට වෙනස් වීමට ද ඉඩ ඇත. උද්ධමනය ඉහළ යෑමේ අවදානමක් පවතින විට දී පොලී අනුපාතික ඉහළ නැංවීම මගින් මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර, මෙය නුදුරු අනාගතයේ දී ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථා නිර්මාණය කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අරමුණුවලින් වෙනස් විය හැකිය. එසේම, ලිහිල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් සිදුවන සමස්ත ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන්, ආර්ථිකයේ පවතින මිල පීඩන පාලනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට සිදුවන අවස්ථා ද පැවතිය හැකිය. මෙවැනි පරස්පරතා පැවතිය ද, එක් එක් පාර්ශ්වයේ අරමුණු, ස්වාධීනත්වය, සහ වගවීම කෙරෙහි අවධානය යොමු කරමින්, ඵලදායී මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණයක් පවත්වාගෙන යෑම රටක දිගු කාලීන සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ආර්ථික වර්ධනය කරා යන ගමනට මනා පිටුවහලක් වේ.

ශ්‍රී ලංකාව තුළ, මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය කාලයත් සමඟ සැලකිය යුතු ලෙස විකාශනය වී ඇත. 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ, මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය සමීපව ඒකාබද්ධ වී තිබුණ ද එම කාල පරිච්ඡේදයෙන් වැඩි කාලයක් තුළ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙන් මුදල් ප්‍රතිපත්තියට වූ බලපෑම ඉහළ යෑම නිසා මුදල් ප්‍රතිපත්තියේ ස්වාධීනත්වය සීමිත වූ අතර රජයේ අයවැය හිඟය මූල්‍යනය සඳහා සහාය දැක්වීමට මහ බැංකුවට බොහෝ විට සිදු විය. මෙම රාමුව 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ, වඩාත් ශක්තිමත් සහ පැහැදිලිව නිර්වචනය කරන ලද ආයතනික විධිවිධානයක් බවට පරිවර්තනය විය. මෙම නව නෛතික රාමුව මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම, වගවීම සහ විනිවිදභාවය පුළුල් කිරීම, ප්‍රතිපත්තිමය අවශ්‍යතා පැහැදිලිව අර්ථ දැක්වීම සහ ඵලදායී මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීම ශක්තිමත් කරමින් සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කරයි.

### ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමට පෙර මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය

මුදල් නීති පනත බලාත්මක වීමත් සමඟ, මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය රටේ ආයතනික රාමුවට ඇතුළත් කෙරිණි. මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධතියේ පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය ලෙස මහ බැංකුව ස්ථාපිත කරන ලදී. එමගින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා අනුකූල වන පරිදි මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යුහාත්මක රාමුවක් ද සපයන ලදී. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ඇතුළත් කෙරුණු අතර, මහ බැංකුව රජයේ රාජ්‍ය මූල්‍ය නියෝජිතවරයා, බැංකුකරුවා සහ මූල්‍ය උපදේශකවරයා ලෙස නම් කරන ලදී. එසේම, තාවකාලික අත්තිකාරම් සහ අනෙකුත් ණය ක්‍රම මගින් රජය වෙත මූල්‍යන පහසුකම් සැපයීමට මුදල් නීති පනත මගින් මහ බැංකුවට අවසර ලබා දී තිබුණි. සාර්ව ආර්ථික අභියෝගවලට මුහුණ දෙමින් ආර්ථික වර්ධනය, මිල ස්ථායීතාව සහ රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම උදෙසා, 1950 වසරේ සිටම, රාජ්‍ය මූල්‍ය අධිකාරීන් සහ මහ බැංකුව මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කරන ලදී. කෙසේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය තුළ රජයේ අයවැය හිඟය දිගු කලක් තිස්සේ විශාල වශයෙන් පැවතීම හේතුවෙන් රජය විසින් මූල්‍යනය සඳහා මහ බැංකුව මත වැඩි වශයෙන් රඳා පැවතීම උද්ධමන පීඩන සහ බාහිර අසමතුලිතතා ඇති වීමට හේතු වූ අතර, විශේෂයෙන්ම, රාජ්‍ය මූල්‍ය ප්‍රසාරණය ආර්ථිකයේ දරාගැනීමේ ධාරිතාව ඉක්මවා ගිය අවස්ථාවල දී මෙම තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබුණි. මෙම තත්ත්වය මගින් "Unpleasant Monetarist Arithmetic" සංකල්පය (Sargent Wallace, 1981)[1] නිරූපණය කෙරේ. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය අධිකාරීන් අඛණ්ඩව තිරසර නොවන අයවැය හිඟයක් පවත්වාගෙන යන්නේ නම්, උද්ධමනය පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන දැඩි මුදල් ප්‍රතිපත්ති ද අසාර්ථක විය හැකි අතර, එමගින් මුදල් ප්‍රසාරණය හරහා අයවැය හිඟය මූල්‍යනයට මහ බැංකුවට සිදුවන අතර ඉන් අනාගත මිල ස්ථායීතාව කෙරෙහි බලපෑම් ඇති විය හැකිය. මුදල් නීති පනත මගින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සඳහා නිල රාමුවක් සැපයුව ද, එම පනත යටතේ, අයවැය හිඟය මූල්‍යනය සඳහා මහ බැංකුව මත රඳා පවතිමින් මුදල් ප්‍රතිපත්තිය කෙරෙහි බලපෑම් කිරීමේ අවස්ථාව ද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට හිමි විය. මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය

1 Sargent, T. J., & Wallace, N. (1981). Some unpleasant monetarist arithmetic. In Monetarism in the United Kingdom (pp. 15-41). London: Palgrave Macmillan UK.

පීඩනවලින් ප්‍රමාණවත් ලෙස වෙන් වී නොතිබීම හේතුවෙන් 2022 වසරේ දී අත්විඳීමට සිදු වූ පෙර නොවූ ආකාරයේ සමාජ-ආර්ථික අර්බුදයට මෙම ව්‍යුහාත්මක දුර්වලතාව ද යම් දුරකට හේතු විය හැකි අතර, එමගින් මහ බැංකුවට ස්වාධීන හා ඵලදායී ලෙස කටයුතු කිරීමට තිබූ හැකියාව සීමා විය.

### මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම උදෙසා ගනු ලැබූ මෑත කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

පෙර පැවති නෛතික සහ මුදල් ප්‍රතිපත්ති රාමුවේ පැවති දුර්වලතා හඳුනා ගනිමින් සහ මහ බැංකුකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් අනුගමනය කරමින් 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී මුදල් නීති පනත අවලංගු කර මහ බැංකු පනත හඳුන්වා දෙන ලදී. මෙම පනත මගින්, මහ බැංකුවේ මෙහෙයුම් ස්වාධීනත්වය ශක්තිමත් කරමින් සහ මුදල් ප්‍රතිපත්තියේ ඵලදායීතාව ඉහළ නංවමින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය නිසා මුදල් ප්‍රතිපත්තියට බලපෑම් සිදු විය හැකි අවස්ථාවන් සැලකිය යුතු ලෙස සීමා කරන ලදී. මහ බැංකු පනත යටතේ සිදු කරන ලද කැපී පෙනෙන ප්‍රතිසංස්කරණයක් වනුයේ මහ බැංකුවේ පාලක මණ්ඩලයෙන් සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාව ඉවත් කිරීම වන අතර, මෙමගින් මුදල් ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ඍජු නියෝජනය ව්‍යුහාත්මකව ඉවත් කර මුදල් ප්‍රතිපත්තියේ ස්වාධීනත්වය තවදුරටත් ශක්තිමත් කර තිබේ. එම පනත යටතේ, මහ බැංකුව විසින් ඍජුව ම රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම වළක්වා ඇති අතර, රජයේ කෙටි කාලීන මුදල් ප්‍රවාහ අවශ්‍යතා කළමනාකරණය කර ගැනීම සඳහා සීමිත තාවකාලික අත්තිකාරම් ලබා දීමට ඉඩ සලසා ඇත. කෙසේ වුවද, 2023 වසරේ දී මහ බැංකු පනත බලාත්මක කිරීමෙන් පසුව රජය මෙම ප්‍රතිපාදන භාවිත කර නොමැති අතර රාජ්‍ය මූල්‍ය විනය සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ඉහළ යෑම ඊට හේතු වී ඇත. මෙම කරුණුවලට අමතරව, ගෝලීය වශයෙන් ඇති වන හදිසි සෞඛ්‍ය තත්ත්වයක් වැනි සුවිශේෂී අවස්ථාවල දී පාර්ලිමේන්තු අනුමැතියට යටත්ව අයවැය හිඟය මූල්‍යනය සඳහා ඉඩ සැලසෙන ප්‍රතිපාදන ද මෙයට ඇතුළත් වේ. මේ අතර, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූල ව, රාජ්‍ය ණය කළමනාකරණ වගකීම් මහ බැංකුව වෙතින් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරීම මගින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මහ බැංකුව සතු ආයතනික ස්වාධීනත්වය තවදුරටත් වැඩිදියුණු කරයි. මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර ඵලදායී සම්බන්ධීකරණය ශක්තිමත් කරමින් මහ බැංකු පනතට අමතර ව, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත බලාත්මක කිරීම මගින් රාජ්‍ය මූල්‍ය විනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. අයවැයකරණය සඳහා පැහැදිලි නෛතික රාමුවක් සැපයීම, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්වල වගවීම ශක්තිමත් කිරීම සහ විනිවිදභාවය ඉහළ නැංවීම මගින් රාජ්‍ය මූල්‍ය පාලන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන පදනම ලෙස 2024 වසරේ අගෝස්තු මාසයේ දී බලාත්මක කළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක වේ.

### ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අතර සම්බන්ධීකරණයේ වත්මන් තත්ත්වය

මෑත කාලීන නෛතික සංශෝධන යටතේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මුදල් ප්‍රතිපත්ති රාමු පැහැදිලිව වෙන් කිරීමත් සමඟ රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණ සභාව ස්ථාපිත කිරීම මගින් මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ආයතනගතකරණය සඳහා මහ බැංකු පනත යටතේ විශේෂ විධිවිධාන සකසන ලදී. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා මහ බැංකුව අතර සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳව සාකච්ඡා පැවැත්වීමේ සහ තොරතුරු හුවමාරු කර ගැනීමේ විධිමත් යාන්ත්‍රණය ලෙස සම්බන්ධීකරණ සභාව කටයුතු කරයි. මහ බැංකු අධිපතිවරයා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සාමාජිකයින් ලෙස කටයුතු කරන මෙම සම්බන්ධීකරණ සභාවට, මහ බැංකුවේ සහ රාජ්‍ය මූල්‍ය අධිකාරීන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී වෙති. කාර්තුමය වශයෙන් රැස් වන මෙම සම්බන්ධීකරණ සභාව, අදාළ මුදල් සහ රාජ්‍ය මූල්‍ය තොරතුරු හුවමාරු කර ගැනීමට අවස්ථාව සලසන අතර ම, වඩාත් දැනුවත් සහ ඒකාබද්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය දක්වයි. සම්බන්ධීකරණ සභා රැස්වීම්වලට සමගාමීව, මෑත කාලයක සිට සම්බන්ධීකරණ සභාවේ කටයුතු පහසු කිරීම සඳහාත් මහ බැංකුව සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අතර විශ්ලේෂණාත්මක මැදිහත්වීම සහ මෙහෙයුම් සම්බන්ධීකරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහාත් මුදල් සහ රාජ්‍ය මූල්‍ය අධිකාරීන්හි අදාළ නිලධාරීන් අතර තාක්ෂණික මට්ටමේ රැස්වීම් ද පවත්වනු ලැබේ.

සම්බන්ධීකරණ සභාවට අමතරව, මහ බැංකු පනත මගින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා ඵලදායී අන්තර්-ආයතනික සම්බන්ධීකරණයක් සපයයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගේ සභාපතිත්වයෙන් යුතු මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව සඳහා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු සහ අනෙකුත් නියාමන ආයතන සහභාගී වෙති. මෙම අන්තර්-ආයතනික ව්‍යුහය මගින්, කාලෝචිත තොරතුරු හුවමාරු කර ගැනීම, ප්‍රතිපත්ති පිළිබඳව දැනුම්වත්ව සිදු කෙරෙන සාකච්ඡා සහ සාර්ව විචක්ෂණ රාමුවක් තුළ පද්ධතිමය අවදානම් මනා සම්බන්ධීකරණයෙන් යුතුව ඇගයීම සඳහා පහසුකම් සලසන අතර, එමගින් සමස්ත මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ සහ මනාව ගැළපෙන ප්‍රතිපත්ති තීරණ ගැනීමට සහාය දක්වයි. මීට අමතරව, මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දීමේ සූදානම ඉහළ නැංවීම සහ මෑත කාලීන ආර්ථික අර්බුදය මගින් මූල්‍ය අංශයට එල්ල වී ඇති වක්‍ර බලපෑම් අවම කිරීම සඳහා 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලදී.

මෙම කමිටුව මගින්, මූල්‍ය පද්ධතිය ආශ්‍රිතව මතු වන අවදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ දී අදාළ බලධාරීන් අතර ඵලදායී සම්බන්ධීකරණයක් ගොඩනගයි.

මේ අතර, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව ස්ථාපිත කරන ලදී. මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා සභාපතිත්වය දරන රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව, මහ බැංකුව විසින් පත් කරන ලද නියෝජිතයින් දෙදෙනෙකු ද ඇතුළුව සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වේ. රාජ්‍ය ණය කළමනාකරණ උපායමාර්ග සමස්ත සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූල වන බව සහතික කිරීම, ණය ගැනීමේ සැලසුම් ඇගයීම සහ දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන් විශ්ලේෂණය කිරීම රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව වෙත පැවරී ඇත. රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව තුළ මහ බැංකුවේ නියෝජනය මගින්, රජයේ ණය කළමනාකරණ තීරණ කෙරෙහි මහ බැංකුවේ සෘජු බලපෑමක් සිදු නොවන පරිදි රාජ්‍ය ණය කළමනාකරණයට සහාය වෙමින් මුදල් සහ රාජ්‍ය මූල්‍ය අධිකාරීන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යනු ලැබේ.

සාර්ව ආර්ථික වශයෙන් වැදගත් කරුණු සම්බන්ධයෙන් මහ බැංකු අධිපතිවරයා සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා අතර පවතින සමීප සහ අඛණ්ඩ සම්බන්ධතාව මගින් මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර ඵලදායී සම්බන්ධීකරණය තවදුරටත් ශක්තිමත් කරයි. ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධව මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය විසින් තීරණ ගැනීමේ දී, එම ගනු ලබන තීරණවල අනුකූලතාව සහ සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා ආයතන දෙකම අතර නිරන්තර සන්නිවේදනයක් සහ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනියි. මීට අමතරව, ආර්ථික ප්‍රතිපත්ති සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් (holistic approach) අනුගමනය කරමින්, සම්බන්ධීකරණය අවශ්‍ය වන කටයුතුවල දී අනෙකුත් අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමග මහ බැංකුව ඵලදායී සම්බන්ධතාවක් පවත්වා ගනියි. විශේෂයෙන්ම, එක්සත් ජනපද තීරුබදු ප්‍රතිපත්ති වෙනස් කිරීම, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වයන් සහ මැදපෙරදිග කලාපයේ වර්ධනය වන යුද්ධමය වාතාවරණය වැනි දේශීය සහ ගෝලීය අවිනිශ්චිතතා ඉහළ මට්ටමක පවතින කාලසීමාවන්හි දී, රජය සහ මහ බැංකුව අතර පැවති මනා සම්බන්ධීකරණය, අවදානම් තක්සේරු කිරීමටත්, කාලෝචිත ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අනුගමනය කිරීමටත් උපකාරී වූ අතර, එමගින් එය සාර්ව ආර්ථික ස්ථායීතාව සුරක්ෂිත කිරීමට සහ ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට දායක විය.

තවද, මහ බැංකු පනතේ විධිවිධාන අනුව, බලධාරීන් අතර පවත්නා ඉහළ සම්බන්ධීකරණයකින් සහ පූර්ණ තක්සේරුවකින් පසුව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ රජය සහ මහ බැංකුව එක්ව උද්ධමන ඉලක්කය තීරණය කරනු ලබයි.

2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු අපේක්ෂා කළ කාලයට පෙර ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම මගින්, සාර්ව ආර්ථික ස්ථායීතාව යළි ඇති කිරීමේ දී මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර ඵලදායී සම්බන්ධීකරණයක් පැවතීමේ වැදගත්කම අවධාරණය කරයි. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි සහාය ඇතිව, නිවැරදි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග, විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්ති මෙන්ම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මගින් උද්ධමනය ස්ථායී තත්ත්වයට පත් කිරීමට, රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් යළි ස්ථාපිත කිරීමට රටට අවස්ථාව හිමි විය. දැඩි ආර්ථික පීඩා පැවති කාලපරිච්ඡේදයකින් පසුව නැවතත් ආර්ථික ස්ථායීතාව ළඟා කර ගැනීමේ දී, මෙම සම්බන්ධීකරණ ප්‍රවේශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.

**නිගමනය**

2022 වසරේ ඇති වූ සමාජ-ආර්ථික අර්බුදයෙන් පසුව හඳුන්වා දෙන ලද මෑත කාලීන නෛතික ප්‍රතිසංස්කරණ මගින්, ඉහළ වගවීම සහ විනිවිදභාවය මත පදනම්ව මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පැහැදිලිව වෙන්කර ඇති අතර ඒවා තවදුරටත් ශක්තිමත් කර ඇත. මේ අතරම, මෙම ප්‍රතිපත්ති මගින් සාර්ව ආර්ථික ස්ථායීතාව සහ තිරසර ආර්ථික වර්ධනයට සහාය දක්වමින්, මුදල්-රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සඳහා වන ශක්තිමත් යාන්ත්‍රණය සුරක්ෂිත කරයි. ඉදිරි කාල වකවානුව තුළ දී, වඩාත් හිතකර ආර්ථික ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මුදල් සහ රාජ්‍ය මූල්‍ය අධිකාරීන් අතර පවතින තිරසර සහ ඵලදායී සම්බන්ධීකරණය අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස පවතිනු ඇත.

## 3.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග

**මහ බැංකුව විසින් 2023 වසරේ මැද භාගයේ සිට ආරම්භ කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, අඩු උද්ධමන පරිසරය සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා මධ්‍යයේ අඛණ්ඩව 2025 වසර තුළ ද පවත්වාගෙන ගියේය.** 2024 වසරේ නොවැම්බර් මාසයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමෙන් පසු 2025 වසරේ මුල් භාගයේ දී ද මහ බැංකුව එම ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගන්නා ලදී. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ යෑමට මෙමගින් ඉඩ සැලසුණු අතර, එය දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට සහ පෞද්ගලික අංශය වෙත සපයන ණය වර්ධනය වීමට හේතු විය. අඩු මට්ටමක පැවති පොලී අනුපාතික මෙන්ම, දිගු කාලයක් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යෑම මධ්‍යයේ වුවද, බලශක්ති මිල

ගණන් අඩු වීමේ බලපෑම හේතුවෙන් උද්ධමනය එහි ඉලක්කයට වඩා අඩු මට්ටමක පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, උද්ධමනය කලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු වේගයකින් සාමාන්‍ය තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. මෙවන් පසුබිමක් යටතේ සහ ශ්‍රී ලංකාවට බලපෑමක් ඇති විය හැකි ගෝලීය අවිනිශ්චිතතා තීව්‍ර වීම මධ්‍යයේ, 2025 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය තවදුරටත් පදනම් අංක 25කින් අඩු කළ අතර, එය ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සම්බන්ධයෙන් එම වසරේ දී සිදු කළ එකම සංශෝධනය විය. වසරේ අග භාගයේ දී කෙටි කාලීන පොලී අනුපාතිකවල තාවකාලික වැඩිවීමක් දක්නට ලැබුණ ද, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කිරීමේ සහාය ලබමින් 2025 වසරේ දී සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය පහළ ගියේය. අඛණ්ඩව මාස 11ක් මුළුල්ලේ පැවති අවධමන තත්ත්වයෙන් පසු 2025 වසරේ අගෝස්තු මාසයේ දී උද්ධමනය නැවතත් ධන අගයකට පත් වීමත්, පෞද්ගලික අංශයට ලබා දුන් ණය අඛණ්ඩව වැඩිවීමත් හේතුවෙන් මහ බැංකුව 2025 වසරේ අග භාගයේ දී සහ 2026 වසර මුල් භාගයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගෙන ගියේය. ඒ අනුව, 2023 වසරේ ජූනි මාසයේ සිට ක්‍රියාත්මකවන මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාවලිය යටතේ 2026 වසරේ මාර්තු මාසය වන විට ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමස්තයක් ලෙස පදනම් අංක 800කින් පමණ අඩු කර ඇත.

**දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරම් සහ ද්‍රවශීලතා තත්ත්ව වර්ධනය වීම මධ්‍යයේ, මහ බැංකුව විසින් 2025 වසර මුල් කාලයේ දී විවට වෙළඳපොළ කටයුතු හරහා ද්‍රවශීලතාව සැපයීම ක්‍රමයෙන් අවම කර පසුව නවතා දමන ලදී.** පැවති අතිරික්ත ද්‍රවශීලතා තත්ත්ව සමඟ, මහ බැංකුව විසින් ද්‍රවශීලතා තත්ත්වයන් සහ එක්දින පොලී අනුපාතිකයෙහි වෙනස්වීම සමීපව නිරීක්ෂණය කරන ලදී. 2025 වසරේ පළමු භාගයේ දී, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාව පිළිබිඹු කරමින්, විශේෂයෙන්, විදේශීය සහ රාජ්‍ය බැංකු විසින් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ සිදු කරන තැන්පතු ප්‍රමාණය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩව ඉහළ යෑමත් සමඟ 2026 වසර මුල් කාලයේ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය කරා ක්‍රමයෙන් ළඟා වූ අතර, ද්‍රවශීලතා අතිරික්තය තවදුරටත් ඉහළ යෑමත් සමඟ 2026 වසරේ පෙබරවාරි මස මැද සිට මහ බැංකුව විසින් එක්දින සහ කෙටි කාලීන පදනමින් ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි ආරම්භ කරන ලදී.

**නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසර පුරා අඛණ්ඩව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය පවත්වා ගෙන යෑමට කටයුතු කළේය.** නම්‍යශීලී විනිමය අනුපාතිකය, විදේශීය සහ දේශීය ආර්ථික කම්පනවලට ප්‍රතිචාර දක්වමින් විනිමය අනුපාතිකය විචලනය වීමට අවස්ථාව සලසමින් ස්වයංක්‍රීයව ක්‍රියාත්මකවන ස්ථායීකරණ විචල්‍යයක් ලෙස ක්‍රියා කරනු ලබයි. එවැනි හැඩගැසීම්, ගෙවුම් තුලනයේ අසමතුලිතතා නිවැරදි කිරීම ඔස්සේ විදේශීය අංශයේ ස්ථාවරත්වය ස්ථාපිත කිරීමට සහාය දක්වයි. තවද, විනිමය අනුපාතිකය පෙර තීරණය කළ මට්ටමක පවත්වා ගැනීම සඳහා විදේශ විනිමය සංචිත භාවිත කිරීමට ඇති අවශ්‍යතාව මෙවැනි තත්ත්වයක අවම වන බැවින් විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්වාධීනත්වය ශක්තිමත් කරනු ලබයි. බාහිර ස්වාරක්ෂක ශක්තිමත් කිරීම සඳහා විදේශීය විනිමය සංචිත ගොඩනැංවීමට සහාය වෙන අතර විනිමය අනුපාතිකයේ අධික උච්චාවචනයන් අවම කිරීම, 2025 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළඳපොළ වෙත කළ මැදිහත්වීම්වල මූලික අරමුණු විය.

**පුළුල් පරාසයක විහිදුණු පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා ඵලදායී ලෙස කළමනාකරණය සඳහා 2025 වසර මුළුල්ලේ මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය අඛණ්ඩව ශක්තිමත් කිරීමට කටයුතු කළේය.** සාම්ප්‍රදායික සන්නිවේදන මෙවලම් භාවිතය පවත්වාගෙන යන අතරතුරම, වඩාත් පුළුල් පිරිසක් වෙත සමීප වීමට සහ ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව නවීන සහ ඩිජිටල් මාධ්‍ය භාවිතය ඔස්සේ සිය සන්නිවේදන කටයුතු තවදුරටත් පුළුල් කරන ලදී. මහ බැංකුව, සිය මුදල් ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රතිපත්තිමය ස්ථාවරය සමස්ත ආර්ථිකය වෙත සන්නිවේදනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය නිවේදන සහ අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාධ්‍ය සාකච්ඡා ඇතුළු සිය ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන මෙවලම් අඛණ්ඩව භාවිත කළේය. මෙම මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය සාකච්ඡා මගින් මුදල් ප්‍රතිපත්ති තීරණ සහ ඒවාට පදනම් වූ හේතු මෙන්ම, විශේෂයෙන් උද්ධමන පුරෝකථන ඇතුළු ආර්ථිකයෙහි ඉදිරි දැක්ම පිළිබඳ පුළුල් ඇගැයීමක් ද සපයයි. සෑම මුදල් ප්‍රතිපත්ති වාර්තාවක්ම නිකුත් කිරීමෙන් අනතුරුව, විශේෂයෙන් උද්ධමනය ඇතුළු ආර්ථිකයේ ඉදිරි දැක්ම සහ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ හරවත් සාකච්ඡාවකට අවස්ථාව සැලසීම සහ අවබෝධය ඉහළ නැංවීම සඳහා මාධ්‍යවේදීන්, ශාස්ත්‍රඥයින් සහ විවිධ අංශවල විශේෂඥයින් සමග තාක්ෂණික සැසි පවත්වන ලදී. තොරතුරුවල අසමමිතික බව අඩු කිරීමට සහ උද්ධමන අපේක්ෂාවන් ස්ථාවරව

3

විශේෂ සටහන 5

## ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මිල අනාවරණය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

### හැඳින්වීම

විවෘත ආර්ථිකයන්හි ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයක් වන විනිමය අනුපාතිකය, වෙළෙඳ තරඟකාරීත්වය, දේශීය මිල ස්ථායිතාව සහ සමස්ත සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරමින් වෙළෙඳ හා ප්‍රාග්ධන චලනයන් සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය හැඩ ගස්වනු ලබයි. විශේෂයෙන්ම, ආනයන මත බෙහෙවින් යැපෙන සහ අපනයන, සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ මෙන්ම මූල්‍ය ප්‍රවාහයන්ගෙන් ලැබෙන විදේශ විනිමය උපයන්නාවූ ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථිකයන් තුළ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමුවේ.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ව්‍යුහාත්මක පරිවර්තනයකට ලක් වී ඇත. එම පනත මගින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් යටතේ නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ස්ථාපිත කරන ලද අතර, විනිමය අනුපාතික තීරණය කිරීමේ පදනම ලෙස වෙළෙඳපොළ මත පදනම් වූ මිල තීරණ කිරීමේ ක්‍රියාවලිය ආයතනිකගත කරන ලදී.

මෙම විශේෂ සටහන මගින් ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මිල අනාවරණය (Price Discovery) කර ගැනීමේ ක්‍රියාවලිය, එහි වැදගත්කම, වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ කාර්යභාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑත කාලයේදී ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ඉදිරි ගමන්මග පිළිබඳව විමසා බැලේ.

### විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මිල අනාවරණය

මිල අනාවරණය යනු, ඉල්ලුම සහ සැපයුම, අවදානම් පිළිබඳ අවබෝධය, තොරතුරු ලබා ගත හැකිබව සහ පවතින ආර්ථික තත්ත්වයන් පිළිබිඹු කරමින් සැබෑ ගනුදෙනු මත පදනම්ව වෙළෙඳපොළ මිල තීරණය කිරීමේ ක්‍රියාවලියයි (Rosenberg and Traub, 2009).

ආර්ථික තත්ත්වයන් සහ වෙළෙඳපොළ ප්‍රවණතා පිළිබිඹු කරමින්, විනිමය සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අතර අන්තර්ක්‍රියාකාරීත්වය හරහා විනිමය අනුපාතික තීරණය කරන බැවින්, මිල අනාවරණ ක්‍රියාවලියේදී විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. විදේශ විනිමය වෙළෙඳපොළ නව තොරතුරු සඳහා ඉහළ සංවේදීතාවයක් දක්වන අතර ආර්ථික දත්ත, ප්‍රතිපත්තිමය නිවේදන සහ භූ-දේශපාලනික තත්ත්වයන්හි සිදුවන වෙනස්වීම් අනුව විනිමය අනුපාතික ඉතා වේගයෙන් වෙනස් වේ. මහ බැංකු, වාණිජ බැංකු, ආයතනික ආයෝජකයන්, සමායතන සහ සිල්ලර වෙළෙඳුන් වැනි අනන්‍ය වූ ඉලක්ක සහ අවදානම් නැඹුරු සහිත විවිධ සහභාගිවන්නන්ගේ අන්තර් ක්‍රියා හරහා විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මිල අනාවරණය සිදුවේ. සාර්ව ආර්ථික ප්‍රවණතා, ප්‍රාග්ධන ප්‍රවාහ සහ අපේක්ෂාවන් අනුව හැඩගැසුණු වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ සාමූහික ගනුදෙනු, විනිමය අනුපාතික තීරණය කරන අතර එමගින් විදේශ විනිමය වෙළෙඳපොළ ඉතා කාර්යක්ෂම බවට පත් කරන අතර මිල තීරණය වීමට තොරතුරු සම්පාදනය කරයි (Bank for International Settlement, 2023).

### මිල අනාවරණය කර ගැනීමේ වැදගත්කම සහ එහි ආර්ථික ප්‍රතිලාභ

විදේශ විනිමය වෙළෙඳපොළ තුළ සිදුවන සඵලදායී මිල අනාවරණය කිරීමේ ක්‍රියාවලිය හරහා, විනිමය අනුපාතිකය ආර්ථිකයක තරඟකාරිත්වය පිළිබඳ ඉක්මනින් ලැබෙන මනා සංඥාවක් ලෙස ක්‍රියා කරයි. වෙළෙඳපොළ මත පදනම් වූ මිල අනාවරණය කිරීමේ ක්‍රියාවලියක් නොමැතිවීම මගින් ආර්ථික සංඥා විකෘති වන අතර එමගින් වැරදි වෙළෙඳපොළ මිලගණන් නියම වීම, අකාර්යක්ෂම ආයෝජන තීරණ සහ අවසානයේ සම්පත් වැරදි ලෙස වෙන් කිරීම, වර්ධනය මන්දගාමී වීම, දුර්වල මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ බාහිර කම්පනවලට ඇති අවදානම වැඩිවීම වැනි තත්ත්වයක් ඇති වේ.

සඵලදායී මිල අනාවරණය ක්‍රියාවලියක් මගින් විනිමය අනුපාතිකය සැබෑ ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් පිළිබිඹු කරන බව සහතික කරන අතර, එය වෙළෙඳපොළ තරඟකාරිත්වය, ආයෝජන තීරණ සහ ව්‍යාපාර සැලසුම්කරණය සඳහා සහාය වෙමින් ඵලදායිතාව සහ ආර්ථික වර්ධනය ඉහළ නංවයි. තවද, විනිමය අනුපාතිකය නිර්ණය කිරීම විනිවිද භාවයකින් යුක්ත බවටත් වෙළෙඳපොළ ආයෝජකයින්ට විශ්වාසයක් ඇති කිරීම මගින් සෘජු විදේශ ආයෝජන සහ කළඹ ආයෝජන ගලා ඒම් සඳහා මෙය රුකුලක් වේ.

තවද, පොලී අනුපාතික තීරණ වලට අනුකූලව විනිමය අනුපාතික වෙනස් වීමට ඉඩ දීම මගින් මිල අනාවරණය, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ද ශක්තිමත් කරයි. උද්ධමන ඉලක්කගත රාමුවක් යටතේ, වෙළෙඳපොළ බලවේග මත පදනම්ව තීරණය වන විනිමය අනුපාතිකය කම්පන අවශෝෂණය කරගන්නා සාධකයක් ලෙස ක්‍රියා කරන අතර, එය මූලික ආර්ථික මූලධර්ම පිළිබිඹු කරමින් පොලී අනුපාතික ප්‍රතිපත්තියට අනුකූලව මුදල්

ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය කිරීමට දායක වේ. තවද, විනිවිද භාවයකින් යුතුව මිල අනාවරණය සමපේක්ෂණ හැසිරීම සහ සමාන්තර වෙළඳපොළවල විනිමය අනුපාතික තීරණය වීම සඳහා ඇති ඉඩකඩ සීමා කරයි. අවසාන වශයෙන්, ව්‍යුත්පන්න වෙළඳපොළවල සංවර්ධනය වීමට ඇති අවස්ථා නිර්මාණය කිරීමෙන් මූල්‍යමය වශයෙන් පුළුල් වෙළඳපොළ සඳහා දායක වන අතර, එමගින් ව්‍යාපාරවලට විනිමය අනුපාතික මගින් ඇතිවන අවදානම අඩු කිරීමට ඉඩ සලසයි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්කල නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමත් දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සඳහා නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සමඟ, ශක්තිමත් මිල අනාවරණය කර ගැනීමේ ක්‍රියාවලියක වැදගත්කම වර්ධනය වී ඇත. විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ අපේක්ෂාවන් ස්ථාවර කිරීම මගින්, එය සාර්ව ආර්ථික ස්ථායීතාවයට දායක වන අතර, ආර්ථිකයට දිගුකාලීනව ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි.

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වෙළඳපොළ යථා තත්ත්වයට පත්වීම සහ ස්ථාවර වීමට සඵලදායී මිල අනාවරණය කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රධාන හේතුවක් වී තිබේ. වෙළඳපොළ මත පදනම් වූ මිල නියම කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු වීම නිසා, වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකයෙහි අක්‍රමවත් බවක් ඇති නොවන පරිදි, 2022 වසරේ දී ඉතා අවම මට්ටමක පැවති දළ නිල සංචිත 2025 වසර අවසානය වන විට වඩාත් ශක්තිමත් මට්ටමක් දක්වා නැවත ගොඩනැගීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය. විශේෂයෙන්ම 2025 වසරේදී විදේශ විනිමය ගැලපුම් පද්ධතිය (Electronic Matching Platform) හඳුන්වාදීමත් සමඟ අන්තර් බැංකු වෙළඳපොළ ක්‍රියාකාරකම් ඉහළයාම මෙයට තවදුරටත් රුකුලක් විය. එමඟින් තරගකාරී මිලගණන්, ද්‍රවශීලතාව සහ වෙළඳපොළ ක්‍රියාකාරිත්වය වර්ධනය විය. 2023 සහ 2024 වසරවලදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය වූ අතර, සමාන්තර වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකය සඳහා ඇති ආන්තිකය අහෝසි කරමින්, සියලුම විදේශ විනිමය ගනුදෙනු සඳහා විනිවිදභාවය සහිත පදනම් අනුපාතික ලෙස විනිමය අනුපාතිකය විශ්වාසනීය දර්ශකයක් ලෙස තහවුරු විය.

### මිල අනාවරණය කර ගැනීමේ දී වෙළඳපොළ සහභාගිවන්නන්ගේ කාර්යභාරය

මිල අනාවරණය කර ගැනීමේ කාර්යක්ෂමතාව කෙරෙහි වෙළඳපොළ සහභාගිවන්නන්ගේ විවිධත්වය සහ ඔවුන්ගේ හැසිරීම බලපාන අතරම විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේග මත තීරණය වීමට ඉඩ හරින අතරතුර, ක්‍රමවත් වෙළඳපොළ තත්ත්වයන් සහතික කිරීමට සහ විශ්වාසය පවත්වා ගැනීම සඳහා මහ බැංකු ඉටුකරන කාර්යභාරය ද වැදගත් වේ (Osler, Mende and Menkhoff, 2011). ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු, ප්‍රධාන අතරමැදියන් සහ වෙළඳපොළ සම්පාදකයින් ලෙස කටයුතු කරමින්, අන්තර් බැංකු සහ පාරිභෝගික ගනුදෙනු සඳහා සහාය දක්වයි. තවද, අපනයනකරුවන්, ආනයනකරුවන්, ආයතනික ආයෝජකයින්, විදේශීය ආයෝජකයින් සහ විදේශ සේවා නියුක්තිකයන්, වෙළඳාම සහ ආයෝජන මත පදනම් වූ විදේශ විනිමය ඉල්ලුම සහ සැපයුම හරහා මේ සඳහා දායක වේ. පුළුල් පරාසයක පැතිරෙන නියෝජිතයන්ගේ සක්‍රීය දායකත්වය මගින් විනිමය අනුපාතිකය තුළින් ආර්ථිකයේ මූලිකාංග නිවැරදිව නිරූපණය වන බව සහතික කරයි.

විනිමය අනුපාතිකය වෙළඳපොළ මත පදනම් වූ මිල තීරණය කිරීමේ ක්‍රියාවලිය හරහා තීරණය වීමට ඉඩ හරින අතරම, මූලික වශයෙන් සංචිත ගොඩනැගීම සහ වෙළඳපොළ තුළ විධිමත් තත්ත්වයන් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය වෙළඳපොළට සක්‍රියව මැදිහත් වෙයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන වෙළඳපොළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් මගින් විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ වෙළඳපොළ ගැඹුර තවදුරටත් ඉහළ නංවයි.

### ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ සඳහා පදනම් විනිමය අනුපාතිකයක් (Reference Exchange Rate) හඳුන්වා දීම

ද්‍රවශීලතාව වර්ධනය කිරීම සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත විවිධ වැඩසටහන් හඳුන්වා දෙමින් සිටියි. ශ්‍රී ලංකා මහ බැංකුව, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2024 වසරේ දී විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය (Foreign Exchange Global Code) සම්මත කර ගැනීම දේශීය විදේශ විනිමය වෙළඳපොළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල කිරීමේ ප්‍රධාන සන්ධිස්ථානයක් විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2026 වසර සඳහා වූ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයෙහි ප්‍රකාශයට පත් කර ඇති පරිදි, විනිවිද භාවයකින් යුතු, වෙළඳපොළ තත්ත්වයන් නිවැරදිව පිළිබිඹු කරනු ලබන විනිමය අනුපාතික තුළින් මිල අනාවරණය කර ගැනීම වැඩිදියුණු කිරීම සඳහා 2026 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ සඳහා දිනය තුළ දී ගණනය කරනු ලබන විනිමය අනුපාතික හෙවත් පදනම් විනිමය අනුපාතිකය හඳුන්වා දීමට නියමිතය. ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන් අනුගමනය කරමින්,

3

විශේෂයෙන් මූල්‍ය පදනම් දර්ශකවල විශ්වාසනීය බව, සහ වගවීම සහතික කිරීම සඳහා පුළුල් රාමුවක් සපයන මූල්‍ය පදනම් දර්ශක සඳහා වන ජාත්‍යන්තර සුරැකුම්පත් කොමිසන් සභාවේ (International Organization of Securities Commission) මූලධර්ම වලට අනුකූලව එය සම්පාදනය කර ඇත.

වෙළඳපොළ සැබෑ ක්‍රියාකාරීත්වය පුළුල් පරාසයකින් ග්‍රහණය කර ගැනීම සඳහා ගනුදෙනු පදනම පුළුල් කිරීම මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින සැබෑ ගතිකතාවයන් මෙම දර්ශකයෙහි සැලසුමට ඇතුලත් වේ. නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය යන දෙකම සහතික කරමින්, විෂමතාවන් ඉවත් කිරීම ඇතුළුව ශක්තිමත් කරන ලද දත්ත වලංගුකරණ ක්‍රියාවලියකින් එය සමන්විත වේ. එ.ජ. ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකරන එතැන් (Spot) විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සපයන මධ්‍යම සීමිත ඇණවුම් පද්ධතියක් වන, 2025 වසර මුල් භාගයේදී දේශීය අන්තර් බැංකු වෙළඳපොළ සඳහා හඳුන්වා දුන්, විදේශ විනිමය ගනුදෙනු ගැලපුම් පද්ධතිය (Foreign Exchange Matching Platform) මේ සඳහා තබන ලද පියවරකි.

ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය (Sri Lanka Forex Association) සහ ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන සාමාජිකයන්ගෙන් සමන්විත දැනටමත් පිහිටුවා ඇති අධීක්ෂණ කමිටුවක් සහිත ස්වාධීන අධීක්ෂණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම හරහා මෙම යෝජිත පදනම් විනිමය අනුපාතිකයේ පාලන විධිවිධාන ශක්තිමත් කරමින් පවතී. ප්‍රායෝගික අදාලත්වය සහතික කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි තාක්ෂණික සහාය ලබා ගැනීම, අනෙකුත් රටවල දැනුම සහ අත්දැකීම් උපයෝගී කර ගැනීම මෙන්ම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් කළේය.

යෝජිත පදනම් විනිමය අනුපාතිකය මගින් ඉදිරි ගනුදෙනු, හුවමාරු ගනුදෙනු සහ විකල්ප ගනුදෙනු (Forwards, Swaps, Options) වැනි අවදානම් කළමනාකරණ මෙවලම් සංවර්ධනය කිරීමට පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම හරහා, වෙළඳපොළ විශ්වාසය ශක්තිමත් කරන අතරම, වෙළඳපොළ තත්ත්වයන් පිළිබඳ පැහැදිලි සංඥාවක් ලබා දීම මගින් මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලියද තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.

**සමෝධානය**

දේශීය විදේශ විනිමය වෙළපොළෙහි නිසි ක්‍රියාකාරිත්වය මෙන්ම පුළුල් සාර්ව ආර්ථික රාමුවෙහි ක්‍රියාකාරිත්වය සඳහා කාර්යක්ෂම මිල අනාවරණය කිරීමේ ක්‍රියාවලියන් අත්‍යවශ්‍ය වේ. එබැවින් විනිවිද භාවයකින් යුතු සහ මනා පාලනයකින් යුක්ත වෙළඳපොළ ක්‍රියාවලියක් හරහා මිල තීරණය වන බව සහතික කිරීම ඉතා වැදගත් වේ. මිල අනාවරණය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තවදුරටත් පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දැනට ක්‍රියාත්මක කරන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල මගින් ඉහළ දායකත්වයක් සිදු කරන අතර, මෙම පියවර ශ්‍රී ලංකාවේ තිරසාර සැබෑ ආර්ථික ක්‍රියාකාරිත්වයට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.


ආශ්‍රිත මූලාශ්‍ර

1. Bank for International Settlements (2023)'The Foreign Exchange Market', BIS Working Papers, No. 1094.
2. Bloomberg (2025) 'Foreign Exchange Market in Sri Lanka Chooses Bloomberg FXGO's Electronic Matching System for the Interbank Foreign Exchange Market', Press Announcement, March 2025.
3. International Monetary Fund (2024) Sri Lanka: Staff Report for the Third Review Under the Extended Fund Facility. IMF Country Report No. 24/161.
4. International Organization of Securities Commissions (2013) Principles for Financial Benchmarks: Final Report, FR07/13. Madrid: IOSCO.
5. Osler, C.L., Mende, A. and Menkhoff, L. (2011) 'Price Discovery in Currency Markets', Journal of International Money and Finance, 30(8), pp. 1696–1718.
6. Rosenberg, J.V. and Traub, L.G. (2009)'Price Discovery in the Foreign Currency Futures and Spot Market', Federal Reserve Bank of New York Staff Reports, No. 262.


පවත්වා ගැනීම තවදුරටත් ශක්තිමත් කිරීමට මෙම මුලපිරීම් දායක විය. වසර පුරාම මුදල් ප්‍රතිපත්ති ප්‍රවණතාවයන් පිළිබඳ සම්මුඛ සාකච්ඡා සහ සංවාද පැවැත්වීම මගින් මහ බැංකුව ජනමාධ්‍ය සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමට කටයුතු කළ අතර, එමගින් මුදල් ප්‍රතිපත්තිය සහ සාර්ව ආර්ථික තත්ත්වයන් පිළිබඳ හරවත් මහජන සංවාදයකට පහසුකම් සැලසීය. ඊට සමගාමීව මහ බැංකුව සිය මහජන සබඳතා වැඩිදියුණු කර ගැනීම සඳහා ඩිජිටල් සහ සමාජ මාධ්‍ය ජාල භාවිතය පුළුල් කළ අතර, සරල සන්නිවේදන ක්‍රමවේද භාවිතය කෙරෙහි ද යොමු විය. මුදල් ප්‍රතිපත්ති සහ එහි ප්‍රවණතා පිළිබඳ මහජන අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා සමාජ මාධ්‍ය සටහන්, තනි පිටුවක අන්තර්ගත කෙරුණු සංක්ෂිප්ත ප්‍රතිපත්ති සංග්‍රහ, කෙටි වීඩියෝ දර්ශන සහ සියලුම ජාතික භාෂාවලින් ප්‍රකාශිත පුවත්පත් චිත්‍ර කතා ද මෙම ක්‍රමවේද අතරට අයත් විය. සිසුන්, ගුරුවරුන් සහ රජයේ නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ විවෘත දින වැඩසටහන් සහ අධ්‍යාපනික සැසි ඇතුළු ඉලක්කගත දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් හරහා මහ බැංකුව විවිධ පාර්ශ්වකරුවන් අතර

සම්බන්ධීකරණය ශක්තිමත් කළ අතර, එයින් මහ බැංකුව සහ මහජනතාව අතර පවතින සබඳතාව තවදුරටත් පුළුල් ලෙස ශක්තිමත් විය.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කැපවී සිටියේය.** ඒ අනුව, රජයට ලබා දෙන ශුද්ධ ණය ප්‍රමාණය සම්බන්ධයෙන් වන විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකය සපුරාලීමට ශ්‍රී ලංකා මහ බැංකුව සමත් විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම හරහා මෙම වැඩසටහන යටතේ වන ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සපුරා ගැනීමට දායක විය.

## 3.3 විදේශීය අංශයේ ප්‍රතිපත්ති

### විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග

**දේශීය විදේශ විනිමය වෙළඳපොළ ආශ්‍රිත හිතකර වර්ධනයන් සහ බාහිර ස්වාරක්ෂක ශක්තිමත් වීම සැලකිල්ලට ගනිමින්, ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ලෙස 2020 වසරේ දී ප්‍රාග්ධන ගිණුම් මත පනවා තිබූ තාවකාලික අත්හිටුවීම් සහ සීමාවන් ලිහිල් කිරීම 2025 වසරේ දී ද අඛණ්ඩව සිදු කෙරුණි.** එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts) හරහා සිදු කරන ප්‍රතිමුඛ ආයෝජන සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts) හරහා සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් කරනු ලබන ප්‍රේෂණ ගෙවීම් මත පනවා තිබූ සීමාවන් ද 2025 වසරේ දී සැලකිය යුතු ලෙස ලිහිල් කෙරුණු අතර, එමගින් දේශීය ව්‍යවසායකයන්ට සිය ගෝලීය ප්‍රවේශය පුළුල් කර ගැනීමට අවස්ථාව හිමි විය. මේ අතර, නේවාසිකයන් සතු පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts) හරහා සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අවසරලත් සීමා ඉහළ නැංවූ අතර, එමගින් පවතින නියාමන සහ වාර්තාකරණ අවශ්‍යතාවලට යටත්ව, පුද්ගලයින්ට නීත්‍යානුකූල ප්‍රතිමුඛ ප්‍රාග්ධන ගනුදෙනු කිරීම සඳහා වැඩි නම්‍යශීලී තත්ත්වයක් ඇති කරන ලදී. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ පනවා ඇති අනෙකුත් ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ද, ගෙවුම් තුලනයේ සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තත්ත්ව ආශ්‍රිත ප්‍රවණතාවලට අනුකූලව, ක්‍රමයෙන් ඉවත් කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

**විදේශ විනිමය ගනුදෙනු සිදු කරන වෙළෙඳුන් අතර අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා 2025 වසරේ දී මහ බැංකුව ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දුන්නේය.** මෙමෙහෙයුම් විනිවිදභාවය සහ නියාමන අධීක්ෂණය වැඩිදියුණු කිරීමේ අරමුණින්, 2025 වසරේ දී මහ බැංකුව විසින් බලයලත් මුදල් හුවමාරුකරන්නන් වෙත සවිස්තරාත්මක මාර්ගෝපදේශයක් සමගින් සංශෝධිත විධාන නිකුත් කරන ලදී. මෙමෙහෙයුම් ප්‍රමිතීන්, වාර්තාකරණ අවශ්‍යතා සහ අනුකූලතා රාමුව ශක්තිමත් කිරීම කෙරෙහි මෙම සංශෝධන මගින් අවධානය යොමු කෙරුණු අතර, විදේශ විනිමය ගනුදෙනුවල අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා එයින් දායකත්වය ලැබුණි. තවද, නියාමන රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, බලයලත් අලෙවිකරුවන් සහ බලයලත් මුදල් හුවමාරුකරන්නන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමය නිකුත් කිරීම් තත්කාලීන පදනමින් වාර්තා කිරීම සහ අධීක්ෂණය සඳහා මහ බැංකුව විසින් වෙබ් පාදක යෙදවුමක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලදී. මෙම යෙදවුම 2026 වසරේ දී සියලුම බලයලත් අලෙවිකරුවන් සහ බලයලත් මුදල් හුවමාරුකරන්නන් වෙත හඳුන්වා දීමට සැලසුම් කර ඇත. තවද, මෙරටින් සිදු කරන ලද අපනයන සහ රටට ආපසු ගෙනෙන ලද අපනයන ආදායම සංසන්දනය කිරීමේ නිරවද්‍යතාව ඉහළ නැංවීමට අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කෙරුණි. එමෙන්ම, ශ්‍රී ලංකා රේගුව සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන, අත්තිකාරම් ගෙවීම් මත පදනම් වූ භාණ්ඩ ආනයන නියාමන යාන්ත්‍රණය විධිමත් කෙරුණු අතර, එමගින් ජංගම ජාත්‍යන්තර ගනුදෙනු අධීක්ෂණ කටයුතු ශක්තිමත් විය. මේ අතර, මහ බැංකුව විදේශ විනිමය සම්බන්ධ නෛතික සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් විදේශ විනිමය පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියට අඛණ්ඩව සම්බන්ධව කටයුතු කළේය.

### ආනයන සීමා ලිහිල් කිරීම

**2025 වසරේ දී, මහ බැංකුවේ උපදෙස් ද සහිතව, රජය විසින් වාහන ආනයනය ඇතුළු සියලුම ආනයන සීමාවන් සම්පූර්ණයෙන් ම ඉවත් කරන ලදී.** 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව වාහන ආනයන සීමා ලිහිල් කිරීම අදියර වශයෙන් ක්‍රියාත්මක කෙරුණි. ඒ අනුව, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී එහි පළමු අදියර ලෙස මගී ප්‍රවාහන, විශේෂ කාර්ය සඳහා වන වාහන සහ මෝටර් රථ නොවන කාණ්ඩයේ භාණ්ඩ ආනයනය සඳහා අවසර ලබා දෙන ලදී. ඉන් අනතුරුව, 2025 වසරේ ජනවාරි මාසයේ දී වාණිජ සහ භාණ්ඩ ප්‍රවාහන වාහන සහ පුද්ගලික මෝටර්

රථ ආනයන මත පනවා තිබූ සීමා ලිහිල් කිරීමත් සමඟ විදේශ විනිමය හිඟය හේතුවෙන් වසර පහකට ආසන්න කාලයක් පුරා වාහන ආනයනය මත පනවා තිබූ සීමාවන් ක්‍රමානුකූලව ඉවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දීර්ඝ කාලයක් පැවති සීමාවන් ලිහිල් කිරීමෙන් පසුව ඇතිවිය හැකි ඉල්ලුම ඉහළ යෑම පාලනය කිරීම සඳහා රජය විසින් තීරුබදු සහ තීරුබදු නොවන පියවර කිහිපයක් අනුගමනය කළ ද, මෝටර් වාහන ආනයනය ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ වුව ද, මෝටර් වාහන ආනයනයෙන් රජය ලද ආදායම අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත රාජ්‍ය මූල්‍ය ශේෂය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු විය.

3

## 3.4 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති

### සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති

**සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස, මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ බලය මහ බැංකුවට පැවරී ඇත.** ඒ අනුව, පද්ධතිමය වශයෙන් වැදගත් වන මූල්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සම්බන්ධව වැඩිදියුණු කළ සාර්ව විචක්ෂණ අධීක්ෂණයක් අනුගමනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවට තර්ජනයක් වන අවදානම් හඳුනා ගැනීමට, ඇගයීමට, අවම කිරීමට සහ අඛණ්ඩව අධීක්ෂණය කිරීමට පූර්ව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මහ බැංකුව විසින් සිදු කළ යුතුය. මේ යටතේ, 2025 වසරේ දී මහ බැංකුව පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (Domestic Systemically Important Banks – DSIBs) නම් කිරීම සඳහා වන රාමුව සමාලෝචනය කර ප්‍රකාශයට පත්කරන ලදී. ඒ අනුව, 2025 වසරේ අප්‍රේල් මාසයේ දී බලපත්‍රලාභී බැංකු පහක් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු ලෙස නම් කරන ලදී. අහිතකර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කර ගැනීම සඳහා මෙම බැංකු විසින් අතිරේක ප්‍රාග්ධන අධිභාරයක් පවත්වා ගෙන යෑම අනිවාර්ය වේ. මෙම අතිරේක ප්‍රාග්ධන ස්වාරක්ෂක හරහා පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවල අලාභ අවශෝෂණය කරගැනීමේ හැකියාව වැඩිදියුණු කරන අතර එමගින් පද්ධතිමය බාධා ඇති වීමේ හැකියාව අවම කරයි. තවද, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු මගින් ඇතිවිය හැකි අවදානම් සහ දුර්වලතා හඳුනා ගැනීමට සහ සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීමට ප්‍රතිපත්ති නිර්දේශ සැකසීම සඳහා මහ බැංකුව විසින් අවදානම් ඇගයීම් සිදු කරනු ලබයි.

**2025 වසරේ ජූලි මාසයේ දී මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී අදාළ වන වටිනාකම මත ණය අනුපාත (Loan to Value Ratio – LTV) සීමා සඳහා වන සංශෝධන හඳුන්වා දෙන ලදී.** වටිනාකම මත ණය අනුපාත සීමාවන් පැනවීම සාර්ව විචක්ෂණ අරමුණු සමඟ අනුකූල කිරීම මගින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලමක් ලෙස වටිනාකම මත ණය අනුපාත සීමාවල ඵලදායීතාව ඉහළ නැංවීම මෙම සංශෝධන මගින් අපේක්ෂා කරන ලදී. තවද, බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් විසින් මෝටර් වාහනවලට අදාළව ලබා දෙන ණය පහසුකම් කැපී පෙනෙන අයුරින් ඉහළ යෑම හේතුවෙන් මහ බැංකුව 2025 වසරේ නොවැම්බර් මාසයේ දී, ලියාපදිංචි නොකළ සහ ශ්‍රී ලංකාව තුළ වසරකට අඩු කාලයක් භාවිත කර ඇති ලියාපදිංචි කළ ඇතැම් වාහන කාණ්ඩ සඳහා පනවා තිබූ වටිනාකම මත ණය අනුපාත සීමා තවදුරටත් දැඩි කරන ලදී. මෙම ප්‍රතිපත්තිය මගින් මෝටර් වාහනවලට අදාළව ලබා දෙන ණය පහසුකම්වල වර්ධනය සීමා කිරීමට අපේක්ෂා කරන අතර එමගින් ඉහළ ණය වර්ධනය හේතුවෙන් ඇතිවිය හැකි පද්ධතිමය අවදානම් අවම වනු ඇත.

### බලපත්‍රලාභී බැංකුවලට අදාළ ප්‍රතිපත්ති

**2025 වසරේ දී මහ බැංකුව, බලපත්‍රලාභී බැංකුවල යහපාලන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කරන අතරම බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව ශක්තිමත් කිරීමට බලපත්‍රලාභී බැංකු සඳහා විචක්ෂණශීලී නියාමන රැසක් නිකුත් කළ අතර ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම, 2025 වසරේ දී මහ බැංකුව අවධානය යොමු කළ ප්‍රධාන ක්ෂේත්‍රයක් විය. ඒ අනුව, ඩිජිටල් යටිතල පහසුකම් වැඩි වශයෙන් භාවිත වීමත් සමඟ ඇති විය හැකි ඒ ආශ්‍රිත අවදානම් හමුවේ බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තාකරණයේ අවශ්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා 2021 අංක 16 දරන "බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව" පිළිබඳ බැංකු පනත් විධානය තවදුරටත් පැහැදිලි කරමින්, 2025 අංක 02 දරන "බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තාකරණය" පිළිබඳ චක්‍රලේඛය නිකුත් කරන ලදී. බැංකු අංශයේ ස්ථායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතට අනුකූලව, බැංකුවේ

ස්වභාවය, පරිමාණය, ව්‍යුහය, සංකීර්ණත්වය සහ අන්තර් සබඳතා සැලකිල්ලට ගනිමින් ප්‍රතිසාධන සැලසුම් (Recovery Plans – RCPs) සකස් කරන ලෙසට සහ සිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් ප්‍රතිසාධන සැලසුම් මහ බැංකුවට ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී මහ බැංකුව විසින් විධාන නිකුත් කරන ලදී. තවද, දිට්වා සුළි කුණාටුවෙන් සහ ගංවතුර ආශ්‍රිත ආපදා හේතුවෙන් සිය ආදායම් මාර්ගවලට හෝ ව්‍යාපාර කටයුතුවලට සෘජු බලපෑම් එල්ල වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන ක්‍රියාමාර්ග සලසන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙමින් 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී "මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර හේතුවෙන් ඇති වූ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන සැලසීම" පිළිබඳ 2025 අංක 04 චක්‍රලේඛය නිකුත් කරන ලදී. ඒ අනුව, බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ව්‍යාපාර විසින් සහන පහසුකම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර ඒ තුළින් සහන ක්‍රියාමාර්ග සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලැබේ. එමෙන්ම, ප්‍රාග්ධන මට්ටම් ශක්තිමත් කිරීම, සහයෝගීතා ප්‍රතිලාභ හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, අවදානම් විවිධාංගීකරණය සහ බැංකුවල පවතින තාක්ෂණය පදනම් කරගත් මූල්‍ය සේවා දියුණු කිරීම උදෙසා බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීම සඳහා රාමුවක් සකස් කරන ලදී. ඉහත ක්‍රියාමාර්ගවලට අමතරව, බැංකු පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා මහ බැංකුව විසින් 2025 වසරේ දී නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ලබා දුන් සහන ක්‍රියාවට නැංවීම සඳහා වූ අතිරේක සංශෝධනයක්; බැඳියාවන් අතර ගැටුම් අවම කිරීම සඳහා ඇතැම් කොටස් හිමියන් විසින් පත් කරන ලද අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට සහභාගී වීම සීමා කිරීම මගින් ආයතනික පාලනය ශක්තිමත් කිරීමේ අතිරේක සංශෝධනයක්; අදාළ වාර්තාකරණ අවශ්‍යතාවයන් සමඟ රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජය සතු ව්‍යවසායන් වෙනුවෙන් බලපත්‍රලාභී බැංකු විසින් ණයවර ලිපි විවෘත කිරීම සඳහා අනුමත සුරැකුමක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද පොරොන්දු ලිපිය යොදාගත හැකි බව නිශ්චිතව දක්වා, සම්බන්ධිත පාර්ශ්වයන්ට ණය පහසුකම් ලබා දීම පිළිබඳ රෙගුලාසි සංශෝධනයන්; ජංගම බැංකු ඒකක මගින් බැංකු සේවා සැපයීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතා සංශෝධනය කිරීමේ චක්‍රලේඛයක්; සහ වත්කම් ප්‍රමාණය මත පදනම්ව බලපත්‍රලාභී බැංකු සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තු ව්‍යුහය පිළිබඳ නිර්ණයක් මෙම රෙගුලාසි අතරට අයත් වේ.

### මුදල් සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා අදාළ ප්‍රතිපත්ති

**වෙළඳපොළ වර්ධනයන් සහ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදවලට අනුකූලව, මුදල් සමාගම් අංශයේ අවදානම් කළමනාකරණ භාවිතාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් මහ බැංකුව, මුදල් සමාගම් සඳහා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ විධාන නිකුත් කළේය.** මෙම විධාන මගින් මුදල් සමාගම්වල අවධානය, අවදානම් කළමනාකරණ උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි, පාලන ව්‍යුහයන් සහ අවදානම් හඳුනා ගැනීම, ප්‍රමාණ කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා පද්ධති සකස් කිරීම ඇතුළු ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ තීරණාත්මක සංරචක කෙරෙහි යොමු කිරීමට නියම කරන ලදී.

**මුදල් සමාගම් විසින් තැන්පතු ලබා ගැනීමේ දී සහ ණය උපකරණ නිකුත් කිරීමේ දී තිරසර ව්‍යාපාරික ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම සඳහා, මුදල් සමාගම් විසින් පිරිනමනු ලබන හෝ ගෙවනු ලබන තැන්පතු සහ ණය උපකරණ සඳහා උපරිම පොලී අනුපාත තීරණය කිරීමේ ක්‍රමවේදයක් සපයමින් තැන්පතු සහ ණය උපකරණ සඳහා උපරිම පොලී අනුපාත පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී.** තවද, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට යෝජිත සංශෝධන පිළිබඳ මහජනතාවගේ සහ පාර්ශ්වකරුවන්ගේ නිරීක්ෂණ/යෝජනා ලබා ගැනීම සඳහා උපදේශන පත්‍රිකාවක් නිකුත් කරන ලදී. පනත සඳහා යෝජිත සංශෝධන මගින්, මුදල් සමාගම් අංශයේ ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා ශක්තිමත් නියාමන හඳුන්වා දීම, මහජනතාවගේ ප්‍රතිලාභය උදෙසා මුදල් සමාගම්වල විනිවිදභාවය වැඩිදියුණු කිරීම, ශක්‍ය නොවන මුදල් සමාගම් නිරාකරණය සහ ගණන් බේරා වසා දැමීම සඳහා විධිමත් රාමුවක් ස්ථාපිත කිරීම සහ අනවසර තැන්පතු ලබා ගැනීමේ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා මහ බැංකුවේ බලතල වැඩිදියුණු කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කර ගැනුණි.

**2024 දෙසැම්බර් මාසයේ දී මුදල් සමාගම් සඳහා වූ ඒකාබද්ධකරණ සැලැස්මෙහි IIවන අදියර සඳහා සංශෝධිත රාමුව හඳුන්වාදීමත් සමඟ, මහ බැංකුව මුදල් සමාගම් ලබා ගත් ලකුණු මට්ටම් (වාර්තා කළ දත්ත මත පදනම්ව ලබා දුන්) මත පදනම්ව කාර්තුමය වශයෙන් එම සමාගම් අධීක්ෂණය ආරම්භ කළේය.** 2025 වසරේ මාර්තු 31 සිට 2028 වසරේ මාර්තු 31 දක්වා වසර තුනක ක්‍රියාත්මක කිරීමේ කාල රාමුවක් සහිත මෙම ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි අරමුණ ඉහළ ඔරොත්තුදීමේ හැකියාවක් සහිත මුදල් සමාගම් අංශයක් ඇති කිරීමයි. අවදානම් මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරන අතරම, වැඩිදියුණු කළ නියාමන

අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, මුදල් සමාගම් විසින් ක්‍රියාත්මක කරන ලද පියවර සහ පාලන ක්‍රමවේද අඛණ්ඩව අධීක්ෂණය කිරීම මගින් මුදල් සමාගම්වල නියාමන අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන ලදී. මුදල් සමාගම් දෙකක් සඳහා පනවන ලද තැන්පතු, ණය දීම් සහ ණය ගැනීම් සඳහා වූ සීමා එම සමාගම් විසින් අදාළ විචක්ෂණශීලී මාර්ගෝපදේශවලට අනුකූල වීම සැලකිල්ලට ගනිමින් ඉවත් කරන ලදී. තවද, 2025 වසර තුළ, මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන අඛණ්ඩව කඩකරමින්/පටහැනි ලෙස කටයුතු කරමින් පැවති මුදල් සමාගමක් සම්බන්ධයෙන් නිරාකරණ ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර ඒ සඳහා අද්මිනිස්ත්‍රාසිවරයකු (Administrator) පත් කරන ලදී.

**අසාර්ථක මුදල් සමාගම්වලට අදාළ ඈවර කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කෙරුණු අතර, ඈවර කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා එවැනි සමාගම්වල ඈවරකරුවන් සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.** මහ බැංකුවට ලැබුණු පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව, අනවසර තැන්පතු ලබා ගැනීම් සහ මුදල් ව්‍යාපාරවලට එරෙහිව පරීක්ෂණ කිහිපයක් ආරම්භ කර ඇත. තවද, 2025 වසර තුළ, ආයතන කිහිපයක් අනවසර මුදල් ව්‍යාපාර/තැන්පතු ලබා ගැනීමේ නිරත වන බවට තීරණය කර ඇත.

**අවදානම් කළමනාකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ණය අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ විධාන නිකුත් කරන ලදී.** තවද, ඇතිවිය හැකි අවදානම් සහ අනපේක්ෂිත අලාභ අවශෝෂණය කරගැනීම උදෙසා ප්‍රමාණවත් මූල්‍ය ස්වාරක්ෂක පවත්වා ගැනීමට සමාගම්වලට නියෝග කරමින්, ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව පිළිබඳව විධානයක් නිකුත් කරන ලදී.

## රාජ්‍ය ණය කළමනාකරණ ප්‍රතිපත්ති

**රජයේ නියෝජිතයකු ලෙස මහ බැංකුව විසින් මීට පෙර සිදු කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යය, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට පවරන ලදී.** ආයතනික වගවීම ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණ රාමුවේ කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කරන ලද අතර, එය 2025 දෙසැම්බර් මාසයේ දී පූර්ණ වශයෙන් ක්‍රියාකාරී විය. මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 1950 වසරේ සිට ඉටු කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිත කාර්යය සිදු කිරීම අවසන් කිරීමත් සමග, මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වූ මහ බැංකුවේ ආයතනික රාමුව ශක්තිමත් වී ඇත. මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියේ සහ රජයේ සුරැකුම්පත් සඳහා වන මධ්‍යම තැන්පතු පද්ධතියේ මෙහෙයුම්, රාජ්‍ය ණය කළමනාකරණ පනතෙහි සහ මහ බැංකු පනතෙහි අදාළ විධිවිධාන යටතේ, මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. මෙම පැවරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, රාජ්‍ය ණය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීමේ අදියරේ සිට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පූර්ණ වශයෙන් ක්‍රියාකාරී කිරීම දක්වා වූ කාලය තුළ, මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත සහ බහුපාර්ශ්වික තාක්ෂණික සහාය දූත කණ්ඩායම් වෙත අවශ්‍ය තාක්ෂණික දායකත්වය, උපදේශන සහ ශක්‍යතා වර්ධන සහාය ලබා දෙන ලදී. මෙහිදී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2025 වසර තුළ දී රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ නිලධාරීන් හට සේවාව අතරතුර පුහුණුව (on-the-job training) සහ දැනුම හුවමාරු කිරීමේ සැසි ක්‍රියාත්මක කළේය. තවද, 2025 වසරේ ඔක්තෝබර් මස සිට ආරම්භ වී, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සම්පූර්ණයෙන් ක්‍රියාකාරී වීම දක්වා වූ පැවරීමේ කාලය තුළ, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ නම් කරන ලද නිලධාරීන් මහ බැංකු පරිශ්‍රයේ දී අදාළ ණය කළමනාකරණ කාර්යයන් ඉටු කළහ. මෙම කාර්යය පැවරීමේ කාල සීමාව පුරා, ඇති විය හැකි වෙළඳපොළ බාධා අවම කර ගැනීම සඳහා මහ බැංකුව වෙළඳපොළ සහභාගීවන්නන් සමග ක්‍රමවත් හා විනිවිදභාවයෙන් යුතු සන්නිවේදනයක් පවත්වාගෙන ගියේය.

## මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ප්‍රතිපත්ති

**මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමග, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම, මහ බැංකුවේ කාර්යභාරයක් ලෙස හඳුනාගන්නා ලදී.** ඒ අනුව, 2025 වසරේ දී, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට මහ බැංකුව කටයුතු කළේය. 2024 වසර අවසානයේ දී මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග යෙහි පළමු අදියර (2021-2024) සාර්ථකව අවසන් කරන ලද අතර මෙමගින් ලබා ගත් ප්‍රගතිය ඇගයීමට හා අනාගත ප්‍රතිපත්ති දිශානතිය සඳහා වැදගත් කරුණු හඳුනාගැනීමට පළමු අදියරෙහි වාර අවසාන ඇගයීම සිදු කරන ලදී. ඊට සමගාමීව, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානයෙහි (Alliance for Financial Inclusion – AFI) සහාය ඇතිව රට තුළ

මූල්‍ය අන්තර්ගතභාවයෙහි වත්මන් තත්ත්වය පිළිබඳ විස්තීරණ සහ යාවත්කාලීන වූ දත්ත එක් රැස් කරගැනීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික මට්ටමේ සමීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන තිබේ. මෙම ප්‍රයත්නයන් මගින්, ප්‍රධාන පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගත් උපදේශන ක්‍රියාවලියක් හරහා, 2026 වසරේ දෙවන භාගයේ දී සිදු කිරීමට අපේක්ෂිත, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි IIවන අදියර සකස් කිරීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය සාක්ෂරතාවය සහ ඊට අනුරූප කුසලතා සංවර්ධනය, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි මූලික ක්ෂේත්‍ර හතරෙන් එකක් වන අතර, අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව ඒ සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම මහ බැංකුව වෙත පැවරී ඇත. එහි මූලික පියවරක් ලෙස ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) හඳුන්වා දෙන ලද අතර, එහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නංවමින් පවතී. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (United Nations Development Programme – UNDP) මූල්‍ය සහයෝගය ඇතිව, මූල්‍ය සාක්ෂරතාවයෙන් බලගැන්වූ සමාජයක් බිහි කිරීම සඳහා උපායමාර්ගික සහයෝගීතාව ශක්තිමත් කිරීම, දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ ඉලක්කගත මූල්‍ය අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂඥ දැනුම උපයෝගී කර ගැනීමට මහ බැංකුව කටයුතු කළේය.

### ගෙවීම් හා පියවීම් පද්ධති සඳහා වන ප්‍රතිපත්ති

**2025 වසරේ දී, ගෙවීම් පද්ධතිවල කාර්යක්ෂමතාව සහ ස්ථායීතාව වැඩිදියුණු කරමින් ඩිජිටල් ගෙවීම් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් ක්‍රියාත්මක කළේය.** විශේෂයෙන් ගිණුම් අතර ක්ෂණික මුදල් හුවමාරු කිරීම් වැනි ඩිජිටල් ගෙවීම් සේවා දැරිය හැකි මිලකට ලබාගැනීමට සහ ඒ සඳහා යොමු වීම වැඩි කිරීමට සියලුම විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch – CEFT) පදනම් කරගත් ගෙවීම් ක්‍රම හරහා සිදු කරන ගනුදෙනුවල දී අය කරන උපරිම ගාස්තු අඩු කරන ලදී. ඒ අනුව, පාරිභෝගිකයන් විසින් සිදු කරන ක්ෂණික මුදල් හුවමාරු කිරීමක් සඳහා වන උපරිම ගාස්තුව රුපියල් 25ට සීමා කරන ලදී. රජයේ ආයතනවලට සිදු කරන බැංකු ගිණුම් පදනම් කරගත් ක්ෂණික ගෙවීම් දිරිමත් කිරීම සඳහා, GovPay[2] හරහා සිදු කරන ගනුදෙනුවක උපරිම ගාස්තුව රුපියල් 15ක් ලෙස නියම කරන ලද අතර, බදු සහ තීරු බදු වැනි ගෙවීම් සඳහා පහසුකම් සපයන ලංකාපේ මාර්ගගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform – LPOPP) හරහා සිදු කරන ගනුදෙනුවක් සඳහා අය කරන උපරිම ගාස්තුව රුපියල් 50 සිට රුපියල් 25 දක්වා අඩු කරන ලදී. ඩිජිටල් ගෙවීම් ක්‍රම හරහා විශාලත්වයෙන් වැඩි වටිනාකම් සඳහා පහසුකම් සැලසීමට මෙන්ම ක්‍රමයෙන් වෙනස් වන ගනුදෙනු අවශ්‍යතා සපුරාලීම සඳහා, සමූහ වශයෙන් සිදු කරන තත්කාලීන නොවන ගෙවීම් සඳහා පහසුකම් සලසන ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (Sri Lanka Interbank Payment System – SLIPS) හරහා ගනුදෙනුකරුවන් විසින් සිදු කරන මුදල් හුවමාරු කිරීම් වෙනුවෙන් ගනුදෙනුවක උපරිම වටිනාකම රුපියල් මිලියන 5 සිට රුපියල් මිලියන 10 දක්වා වැඩි කරන ලදී. රාජ්‍ය අංශය ද ඩිජිටල් ගෙවීම් සඳහා වේගයෙන් අනුගත වෙමින් සිටින බැවින්, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් මගින් සිදු කෙරෙන රජයට අදාළ ගනුදෙනු සඳහා රුපියල් මිලියන 50ක ඉහළ සීමාවක් ලබා දෙන ලදී.

**LANKAQRහි ගෝලීය සම්බන්ධතාවය වැඩි කිරීමේ සහ මෙරටට පැමිණෙන සංචාරකයින්ට ගෙවීම් සිදු කිරීමේ පහසුව වැඩි කිරීමේ ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යමින්, LANKAQR භාවිත කරන වෙළඳුන් හට ගෙවීම් සිදු කිරීමේ දී AliPay+ පහසුකම සහිත යෙදවුම් භාවිත කිරීමට සංචාරකයින්ට හැකි වන පරිදි, AliPay Singapore E-Commerce පුද්ගලික සමාගම සමඟ හවුල් වීමට ලංකාපේ පුද්ගලික සමාගම වෙත අනුමැතිය ලබා දෙන ලදී.** මෙම හවුල්කාරීත්වය මගින් ඉන්දියාවේ UPI පහසුකම සහිත යෙදවුම්වල සිට බොහෝ ආසියානු රටවල ලබා ගත හැකි AliPay+ පහසුකම සහිත යෙදවුම් දක්වා LANKAQR ඒකාබද්ධ කිරීම පුළුල් කරන ලදී.

**මහ බැංකුව, ජාතික ගෙවීම් කවුන්සිලය සමඟ එක්ව, මූල්‍ය අන්තර්ගතභාවය, කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ ගෝලීය සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රධාන උපායමාර්ගික ක්ෂේත්‍ර හයක් අනුව ගොඩනගා ඇති 2026-2027 සඳහා වන ජාතික ගෙවීම් පද්ධති මාර්ග සැලසුම සකස් කරන ලදී.** ඩිජිටල් ගෙවීම් භාවිතය සඳහා අනාගතයේ දී ඇතිවන ඉල්ලුම සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතිය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා උපායමාර්ගික මගපෙන්වීමක් මෙම මාර්ග සැලසුම මගින් සපයනු ඇත.

**ඉහත කරුණුවලට අමතරව, විදේශ මුදල් හුවමාරු සේවා සපයන්නන් ද ඇතුළත් කිරීම සඳහා නියාමන පරාසය පුළුල් කරමින් සහ අධීක්ෂණ කටයුතු වැඩිදියුණු කරමින් මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සැපයුම්කරුවන් සඳහා වන රෙගුලාසි සංශෝධනය කරන ලදී.** තවද, මූල්‍ය වෙළඳපොළ පද්ධති සඳහා වූ මූලධර්ම සමඟ අනුකූලව ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම්

2 GovPay - විශේෂිත තොරතුරු තාක්ෂණ පද්ධති නොමැති රජයේ ආයතනවලට ක්ෂණික ඩිජිටල් ගෙවීම් පිළිගැනීමට ඉඩ සලසන, 2025 වසරේ පෙබරවාරි මාසයේ දී දියත් කරන ලද ගෙවීම් ක්‍රමවේදයකි.

පාලනය කෙරෙන නෛතික හා නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අරමුණෙන්, මහ බැංකුව 2025 වසරේ දී, නව ගෙවීම් හා පියවීම් පද්ධති පනතක් සම්පාදනය කිරීමෙහි නිරත විය.

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම, සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ප්‍රතිපත්ති

**2025 වසරේ දී, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රවර්ධිත බුද්ධි තොරතුරු උත්පාදනය, ශක්තිමත් කළ අධීක්ෂණය, නෛතික ප්‍රතිසංස්කරණ සහ උපායමාර්ගික සම්බන්ධීකරණය හරහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ, සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික රාමුව ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු විය.** ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ද 2026 දී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (Asia/ Pacific Group on Money Laundering - APG) විසින් සිදුකරනු ලබන තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ශ්‍රී ලංකාව මනාව සූදානම් වී ඇති බව සහතිකවීමට ද මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා, මහ බැංකු අධිපතිතුමාගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මකවන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකාරක කමිටුවේ මගපෙන්වීම යටතේ පියවර රැසක් ගන්නා ලදී. මෙම පියවර අතරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීම පිළිබඳ කාර්ය සාධක බලකාය (AML/ CFT Task Force) විසින් පාර්ශ්වකාර ආයතනයන්හි ක්‍රියාකාරී සැලසුම් අඛණ්ඩව සමීක්ෂණය කිරීම සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ අවදානම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ අවදානම සමඟම සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳව පළමු ජාතික අවදානම ද ආවරණය වන පරිදි 2024/25 ජාතික අවදානම් ඇගයීම නිම කිරීම ද ඇතුළත් වේ.

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම හා සම්බන්ධ ප්‍රධාන නීති සංශෝධනය කරමින් නෛතික ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු කරමින් පවතී.** 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවත්වීමේ සම්මුති පනත සහ 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීම සඳහා වූ මූලික නීති උදෙසා එක් කිරීමට යෝජිත සංශෝධනයන් සිදු කෙරෙමින් පවතින අතර, 2025 අංක 05 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත, 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනත, 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරී පනත, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත සඳහා ද භාර (සංශෝධන) පනත් කෙටුම්පත, රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනත් කෙටුම්පත, විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් සම්බන්ධ පනත් කෙටුම්පත ඇතුළු නව නීති සම්පාදනයන් සඳහා ද තාක්ෂණික දායකත්වය ලබා දී ඇත. තවද, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සඳහා ඉදිරියේ දී ගෙන එන සංශෝධන මගින් සහාය ලබා දෙන, අතථ්‍ය වත්කම් (Virtual Assets - VAs) සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් (Virtual Assets Service Providers - VASPs) සඳහා ක්‍රමානුකූලව ගෙන එනු ලබන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ, සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණ රාමුවක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් ක්‍රියාත්මක කරමින් තිබෙන අතර, අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා විචක්ෂණශීලී නියාමන අවශ්‍යතා අධ්‍යයනය කිරීම සඳහා ඩිජිටල් ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් යුතු උප කමිටුවක් පිහිටුවා ඇත.

### මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති

**ප්‍රතිපත්තිමය ඌනතා හඳුනා ගැනීමට සහ ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතා ඇගයීමට ලක් කිරීම සඳහා, ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව 2025 වසරේ සිව්වන කාර්තුවේ දී පවතින මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව පිළිබඳ පූර්ණ ඇගයීමක් සිදුකිරීම මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී.** මෙම ඇගයීම මගින් දැනට පවතින මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලවන අයුරින් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන අතර එහි දී නෛතික රාමුව ශක්තිමත් කිරීම, නියාමන කටයුතු වැඩිදියුණු කිරීම, ආයතන ශක්තිමත් කිරීම සහ අධීක්ෂණ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍යවන අංශ හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, 2026 වසරේ දී මූල්‍ය ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා නිම කිරීමෙන් අනතුරුව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති රාමුව යාවත්කාලීන කිරීමට මහ බැංකුව සැලසුම් කර ඇත.

**සිය ආයතනික හැකියාව තවදුරටත් ශක්තිමත් කරමින්, මහ බැංකුව විසින් 2025 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ සංවිධානයේ පූර්ණ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.** මෙම සාමාජිකත්වය මගින් දැනුම හුවමාරු කර ගැනීම වැඩිදියුණු

කිරීම, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුගත වීම මෙන්ම මහ බැංකුව තුළ අඛණ්ඩ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා සහාය ලබාගැනීම අපේක්ෂා කෙරේ.

### තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ පිළිබඳ ප්‍රතිපත්ති

**2025 වසරේ දී, මහ බැංකුව විසින් සමස්ත මූල්‍ය පද්ධතිය තුළ නිරාකරණ කටයුතුවල අඛණ්ඩතාව, පෙර සූදානම හා කාර්යක්ෂම ලෙස අර්බුද කළමනාකරණය සහතික කිරීමට බැංකු සහ මුදල් සමාගම් සඳහා වන නිරාකරණ ප්‍රතිපත්ති රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී.** ඒ අනුව, ප්‍රධාන ප්‍රතිපත්තිමය වර්ධනයක් ලෙස, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ Iවන සහ IIවන කොටස් යටතේ පවතින නිරාකරණ විධිවිධාන, එම පනතේ 57වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයක් මගින් සියලුම මුදල් සමාගම් වෙත ව්‍යාප්ත කරන ලදී. මෙම පියවර මගින් බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් යන කාණ්ඩ දෙකම ප්‍රමිතිගත නිරාකරණ පද්ධතියකට යටත් වන අතර, ශක්‍ය නොවන මූල්‍ය ආයතන සඳහා කාලෝචිතව මැදිහත් වීමට සහ ක්‍රමවත් නිරාකරණ ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව සලසයි. මෙමගින් තැන්පත්කරුවන්ට මෙන්ම සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියට ඇති අවදානම් තවදුරටත් අවම කෙරේ.

**නිරාකරණ සූදානම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් මහ බැංකුවේ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස, 2025 අගෝස්තු 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 16 වන වගන්තිය යටතේ, මහ බැංකුව විසින් පාලක මණ්ඩල අනුමැතිය සහිත ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන්ගේ මණ්ඩලයක් පිහිටුවන ලදී.** මෙම මණ්ඩලය, අදාළ බලපත්‍රලාභී බැංකුවේ හෝ මුදල් සමාගමේ වත්කම් හා බැරකම් ස්වාධීනව තක්සේරු කිරීම, අසාර්ථක වීම හෝ අසාර්ථක වීමට ආසන්න තත්ත්වය නිර්ණය කිරීම, නිරාකරණ විකල්ප ඇගයීම සහ "ඈවර කිරීමට වඩා නරක තත්ත්වයකට පත් නොවීම" (No Creditor Worse Off than in Liquidation) යන ආරක්ෂණ මූලධර්මය ක්‍රියාත්මක කිරීම ඇතුළු ප්‍රධාන නිරාකරණ කාර්යයන් සඳහා සහාය ලබා දෙනු ඇත. මෙම මණ්ඩලය පිහිටුවීම මගින් අදාළ කාර්යයන්හි විශ්වසනීයභාවය, පාරදෘශ්‍යතාව සහ නෛතික ශක්තිමත්භාවය තවදුරටත් වර්ධනය වේ.

**එයට අමතරව, 2025 වසරේ දී, මහ බැංකුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත, "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ප්‍රදර්ශනය කිරීම සහ තැන්පතු රක්ෂණ ආවරණය ලබා ගැනීමට ඇති හැකියාව" පිළිබඳ 2025 අංක 02 දරන බැංකු විශේෂ විධිවිධාන පනත් විධානයන් නිකුත් කළේය.** තැන්පතු රක්ෂණය පිළිබඳව මහජන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය පද්ධතිය කෙරෙහි තැන්පතුකරුවන්ගේ විශ්වාසය ඉහළ නැංවීම සඳහා සිදු කරනු ලබන මහ බැංකු ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස, මෙම විධානයන් මගින්, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි සාමාජිකත්වය පිළිබඳව සහ තැන්පතු රක්ෂණ ආවරණය ලබා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ. ඒ අනුව, නියමිත මාර්ගෝපදේශවලට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය සහ තැන්පතු රක්ෂණ ආවරණයට අදාළ තොරතුරු පැහැදිලි හා කැපී පෙනෙන අන්දමින් ප්‍රදර්ශනය කරන ලෙස සාමාජික ආයතනවලින් ඉල්ලා සිටී.

### තිරසර මූල්‍ය සඳහා වන ප්‍රතිපත්ති

**ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ (International Finance Corporation - IFC) සහාය ඇතිව සම්පාදනය කරන ලද තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0, 2025 මැයි මාසයේ දී දියත් කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය තුළ තිරසර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වූ වැදගත් සන්ධිස්ථානයක් විය.** මූල්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ සහාය ඇතිව සංවර්ධනය කරන ලද මෙම මූල්‍ය පෙරදැක්ම, මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම යන මහ බැංකුවේ කාර්යභාරයන්ට අනුකූල වන අතර, මූල්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු, ජාතික පාරිසරික හා සමාජ සංවර්ධන ප්‍රමුඛතාවලට අනුකූලව පෙළගැස්වීම සඳහා ව්‍යුහාත්මක සහ ප්‍රායෝගික රාමුවක් සපයයි. තිරසර භාවය හා බැඳුනු සමාජීය අංශය ඒකාබද්ධ කිරීම මෙම පෙරදැක්ම 2.0හි ප්‍රධාන වැඩිදියුණු කිරීමක් වන අතර එමගින් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ පුළුල් පරාසයක ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වනු ඇත. ඊට සමගාමීව, දේශගුණික විපර්යාසයන්ට මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ වඩාත් තිරසර ආර්ථික පරිවර්තනයක් උදෙසා සහාය වීමට මෙම පෙරදැක්ම වැඩි අවධානයක් යොමු කරයි. තවද, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ සහාය ඇතිව දැනට යාවත්කාලීන කරමින් පවතින හරිත මූල්‍ය වර්ගීකරණය වැඩිදියුණු කිරීම තුළින් තිරසර මූල්‍ය බලගැන්වුම් රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. මෙම ක්‍රියාමාර්ගය තුළින් කාලානුරූපීව වෙනස් වන ගෝලීය භාවිතයන් ඇතුළත් කරමින්, ජාතික තිරසර ප්‍රමුඛතා සමග මූල්‍ය ප්‍රවාහ පෙළගැස්ම වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. තවද, මහ බැංකුව, බලපත්‍රලාභී බැංකුවල තිරසර මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමෙහි අඛණ්ඩව නියැලී සිටින අතර, මේ සම්බන්ධයෙන් වන නව බැංකු පනතේ විධාන 2026 වසරේ දී බලපත්‍රලාභී බැංකු සඳහා නිකුත් කෙරෙනු ඇත.